


# ගුණමිණි පවත

# සිරි ජිනවංස ථේරාපදානය

පද රචනය

දිගන සුගතවංස භික්ෂු



ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා ප්‍රධානාචාර්ය
මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත අති පූජනීය
මාතර ශ්‍රී ඤාණාරාමාභිධාන
නායක මාහිමිපාණන් වහන්සේ.



ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක හා ප්‍රධාන අනුශාසක
මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත අතිපූජනීය කඩවැද්දුවේ ශ්‍රී
ජිනවංසාභිධාන
නායක මාහිමිපාණන් වහන්සේ.

# පිටු පෙළගැස්ම


පිටු පෙළගැස්ම ........................................ iii

පටිග්ගාහාපනං ........................................ v

පඨම වචනං ........................................ iii

ආශිංසනය.... ........................................ v

'නො සුලභෝපමා' වදනක්........ ........................................ vii

සංඥාපනය ........................................ viii

පූර්විකාව......... ........................................ x

විඤ්ඤාපනං ........................................ xiv

01. රතනත්තයාභිවන්දනා ........................................ 5

02 පවෙසනද්වාරං ........................................ 7

03. ලංකා වාසීනං ධම්ම රස කාලො ........................................ 9

04. සමාරම්භිත නිකායත්තය ........................................ 13

05. රාමඤ්ඤ නිකායෙන සද්ධිං භික්ඛු පරම්පරා ........................................ 15

06. රොහණතො ජාත වීරොධරා ........................................ 17

07. ගුණ ගන්ධ පුප්පිත සුගන්ධ පුප්ඵං ........................................ 19

(i) පඨම පාද වාරො ........................................ 19

(ii) උපසම්පදා භාවො ........................................ 23

(iii) ගංගාරාමො භවි පරිවෙණං ........................................ 27

(iv) ව්‍යත්ත බලෙන ච ලෙඛන කුසලෙන ච කත ධම්ම යුද්ධං 29

(v) දුතියාභිනික්ඛමනං ........................................ 31

08. සිරි කල්‍යාණි යොගස්සම සන්ථා’යං ........................................ 33

09. (i) සො ලද්ධං පඨම යොගස්සමං ........................................ 37

(ii)සො ලද්ධා’වසෙස යොග භූමි........................................ 39

(ii) තත් නායකයාණෝ ලත් සෙස නිජ භූමි ........................................ 40

10. සමාරම්භිත යොගාස්සම පඨම පාලක සඞ්ඝසභා ............ 41

11. ගුණගන්ධ පුප්ඵස්ස කතොපහාරං........................................ 45

12. ගුණගන්ධ පුප්ඵෙ ගබ්භිත ධම්ම රසං........................................ 47

13. ගුණගන්ධ පුප්ඵෙ නිට්ඨිත කාලං ........................................ 55

14. අභිවාදන පත්ථනා........................................ 61

15. සෙවිත ගන්ථ නාමාවලී ........................................ 67

16. පුඤ්ඤානුමොදනා ........................................ 69

17. රැඳි මතක සටහන්........................................ 71

18. උපග්‍රන්ථය........................................ 77

# පටිග්ගාහාපනං

**රාමඤ්ඤවංස යති නෙතු වරොස මේධා-**
**ලංකාර නායක මහා ගරු සාමි පාදො,**
**තං සඞ්ඝනෙතු ජිනවංසපදාන පාලි-**
**සංවණ්ණනං මම දයාය පටිග්ගහාතු.**

**කල්‍යාණි සඞ්ඝ සුසහාය සභාපතී ච-**
**පමොක්ඛ ඤාණින සමචනාය ථෙර සාමි,**
**තං සඞ්ඝනෙතු ජිනවංසපදාන පාලි-**
**සංවණ්ණනං මම දයාය පටිග්ගහාතු.**

**යොගඤ්ඤසමාධිපති තත්ථානුසාසකො සො-**
**බුද්ධංකුරො අරියධම්ම මහා යතින්දො,**
**තං පාලියානුගත ථෙරපදාන පාලි-**
**සංවණ්ණනං කතමයා සුපටිග්ගහාතු.**

☸ ☸ ☸ ☸ ☸ ☸ ☸

# පිදුම

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ

ශ්‍රීමත් උත්තරීතර මහා නායක

අති පූජනීය වේවැල්දෙණියේ මේධාලංකාර

නායක ස්වාමින්වහන්සේ,

ශ්‍රී. ක. යෝ. සංස්ථා සංඝසභාවේ

ප්‍රධාන සභාපති ධුරන්ධර

අති පූජනීය මීතුවන්ගමුවේ ඤාණිනාභිධාන

ප්‍රධානාචාර්ය නායක මාහිමිපාණන් වහන්සේ,

ශ්‍රී. ක. යෝ. සංස්ථාධිපති හා ප්‍රධාන අනුශාසක,

මහා ලේඛකාධිකාරී, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය

මහා කම්මවිධානාචාර්ය,

අති පූජනීය ණා උයනේ අරියධම්මාභිධාන

මහෝපාධ්‍යාය නායක මාහිමි පාණන් වහන්සේ,

ප්‍රධාන

මහාසංඝරත්නය වෙත

"ගුණ මිණි පවත නම් වූ සිරි ජිනවංස ථේරාපදානය"

නමැති පද්‍ය වර්ණනාව

ගෞරවාදර භක්තියෙන් පිළිගන්වමි!

පඨම වචනං.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

ගුණ මණි පවත්තනි (ගුණ මිණි පවත) ගාථාසමූහස්ස අභිවාදනපුබ්බං කථයිස්සං. සීල සමාධි පඤ්ඤා ත්‍රිශික්ෂා සංගහිතං සකල සාසන පරිපාලන කරං ගම්භීරත්ථ විනිච්ඡයං මධුරවිල නිබ්බාන සංඛාත සාසන සම්පත්ති සාධකතො, සිරිජින මණි රතන සදිසත්තාය පවත්තිං "ගුණ මණි පවත්තනි" ඉති පඤ්ඤායතෙ,

සම්බුද්ධ සාසන කර ධරිතො සිරි තලල්ලේ ගොනගසාසම නාම සමුප්පාදිත පඨමාචරියස්ස නාමස්ස රත්තිය පාලිත පරම පූජිය කතඤ්ඤුව සිරි ජිනවංසාභිධානස්ස අභිනන්දං ආචරිය වරස්ස ධම්මානුදාන විවරිතං ගෙර මහේසම නමක උපසම්පාදා අනුසාසනීයාවාසික සම්මාදසං ජෙට්ඨ පබ්බජිතානං හිත සුඛාවහනත්ථ කරුණාභාවෙනයං ගුණස්ස අභාලම්බ නිම්මිතත්ථ භූයතෙ,

ගාථාසමූහස්ස කතනා ඓ තත් ගාථායඋ ඛන්ධානර - වරස්ස සීලාසා දීඝාන සුගතවංසසෙවරො, ගොසි කෙසිවක විසාරදෙ සිංහල-පාලි-ආංගලීය-ජර්මන් භාෂා කුසලො ජෙතුලානන්ද විපස්සනාචරියො ගාථාකාරකො මෙම සමථ විපස්සනානුපුබ්බකො, සාසනො මුදුපතෙඩි සීලෙ.

ගාථ පරිමාණති අබව පණ්ඩිතාහාමික සහ ගාථාපි පිටපතං ගිහ කංසබ්බර මනසං, නම්බ් තැපිරි රසයෙ න වුත්තෙසි සතිමණ්ඩපිතං, පාසාජෙත්ම්ස්ස සාසන මනාවර මයිවරා ගංස ගිරානු කුල පොත්තාං සදුම ලුබ්ධා දී මෙව සාසන චිරට්ඨිතත්ථං හොතෙව,

නෙතොවෙම් ගාථා පිටමිතාස්ස ආයසමතො දීඝාන තෙම සුගතවංස අස්ස ආයුං ආරොගියමෙතුම ධම්ම සමථ සමාපත්ති අභිඤ්ඤා විපස්සනා මංගෙවල නිබ්බානාය ගමාය උපනිස්සයො හොතු, අරහත නිබ්බානාය ගමාය උපනිස්සයො හොතු, අනිච්චාන අධිගතමෙ අනිත්තො චිරං දීඝමනුහං අනියතාන පතිට්ඨානසිටි සතානං ආසිංසනං කිදුපනගෙතම න මෙතන මිතෙනතා පත්‍රෙසාම.

"සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා"
ගුණරතන වෙදෙන්

**සිරි කල්‍යාණි යොගස්සමාධිපතිනා පධාන අනුසාසකෙන**

**තිපිටක ධාරිනා අති ගාරව**

**නාඋයනෙ අරිය ධම්ම මහා නායක ථෙරවරෙන ච**

**නාථගන අරඤ්ඤ සෙනාසනාධිපතිනා**

**තිපිටක විසාරදෙන නිරුත්තිකාචරියෙන අති ගාරව**

**හවෙනෙපොලස්ස ගාමෙ චන්දවංස නායක මහා ථෙරවරෙන ච**

**ඉමං ගාථා බන්ධනං සංසොධිතං......**

### ආශිංසනය....

සිරි සම්බුදු සසුන් බර දරන, වියත් විසාරද දහම්-විනය දරන සුසිල්වත් සහ පරපුරකින් හොබනා ලක් දෙරණින් තුල් ලෝ තලයටම දහම් එළිය ලබා දෙන බව වත්මනෙහිද විද්‍යමානය. “සම්මා සම්බුද්ධ රදාණන් වහන්සේ ගේ අරිය සහ පරම්පරාව අද දක්වාම නොකඩ ව, නිරාකුල ව, නිර්මල ව, නරුපද්‍රිත ව ම පවතී” යන අසිරිමත් වචනය කියා පාන්නේ වසර 2600 ක පැහැදිලි ඉතිහාසයකි. වසර 2600 ක් නොවෙනස් වූ එකම සන්නාහය මේ අරිය ධජය හෙවත් චීවරයයි. කෙලෙස් බල මුළු පලවා හැරීමට සුදුසු වූ ද එකම වූ ද මෙම චීවරය දැරූ සුසිල්වත් බුදු පුතුන්ගෙන් සැදුම් ලත් බල කොටුවෙකි සිරිලංකා රාමඤ්ඤ මහ නිකායෙහිම ඇතුළත් වූ පෞරාණික අරණ්‍ය සම්ප්‍රදාය ගරුකොට බිහි වූ කල්‍යාණි යොගාශ්‍රම සංස්ථාව. “පටිපත්ති මූලකං මහාරාජ සත්ථු සාසනං, පටිපත්ති සාරකං මහාරාජ සත්ථු සාසනං පටිපත්තියං ධරන්තං තිට්ඨති” යනුවෙන් සම්බුදු සසුනෙහි මූලය, සාරය, පිහිටීම ප්‍රතිපත්තිය මත පිහිටා තිබෙන බවම නිතර මෙනෙහි කළ බෝසත් ගුණැති තේජෝ බල පැරකුමැති කඩවැද්දුවේ සිරි ජිනවංස පඬි හිමිපාණෝ මෙම කල්‍යාණි යෝගාශ්‍රම බලමුළුව ගොඩනැගීමෙහි පුරෝගාමී වූහ.

මැණිකෙහි ස්වභාවය තමා ආලෝකවත් කරගනිමින්ම බැහැරටත් ආලෝකය ලබා දීමය. ගුණයෙහි ස්වභාවය ද එයමය. තමන් ගුණයෙන් උසස් වී ලොවටම ගුණ බෙදා දීමය. සසුන් ඉතිහාසයේ සහනයු වරු සිදු කලේ ද සසුන් ගුණයෙන් තමා ලැබූ ආලෝකය ලෝසතට සිත් සුපහන් කොට නිවීම, සැනසීම සඳහා ලබා දීමය. සාමාන්‍ය ආලෝකයෙන් සිදු කරනුයේ අව්ලීම, දැල්වීම වැනි ක්‍රියාවන් ය. නමුත් ගුණාලෝකයෙන් සිත් නිවා සනසාලීම සිදු කරයි.

බුදු සසුන තුලින් සිදු වන්නේ ද එයමයි. ඒ අනුව ජිනවංස මහ තෙරපාණෝ උසස් දුර්ලභ ගණයේ ගුණ මැණිකෙකි. තවත් නොයෙක් ගුණ මිණි කැට එක් කොට තිරිවානා දලං බොරළු කැට ඉවත් කොට කල්‍යාණි යෝගාශ්‍රම මැණික් ආකාරය ගොඩ නැගූහ. වසර සැටක කාලයක් එහි ආලෝකයෙන් දෙව් බඹුන් සමඟ සැදැහැවත්හු සැනසූහහ. ඒ ගුණ මිණි පවත මූල භාෂා පැදියෙන් මෙසේ දිග හැරෙන වගයි.

පූජ්‍ය දිගන සුගතවංස දහර යතිවරයන් වහන්සේ විසින් මධුර වූ පද්‍ය විලාෂයකින් වත්මන් යුගයේ හිදැසක් පූර්ණය කරන කිරීම අප කාගේත් අමන්දානන්දයට හේතු වනු ඇත. ළපැටි වියෙහිදීම අග්‍ර ගුණ මිණි කැටයක් වූ කඩවැද්දුවේ පඬි හිමිපාණන්ගේ සුරතින් ගුණ මිණි ආකාරයට ඇතුළත් වූ හෙතෙම පෙර බුදු සසුන් හි යෝගාවචර බව පුහුණු කිරීම, විනයාභිධර්ම සූත්‍ර, ව්‍යාකරණාදියෙහි බහුශ්‍රැත බව, විශේෂයෙන් පාලි භාෂාවෙහි නිපුණ බව, බොහෝ බුද්ධ වචන දරා ගැනීම, අර්ථ විනිශ්චයෙහි ධර්ම විනිශ්චයෙහි දක්ෂ බව, වියත් විසාරද ධර්ම විනියධර ගුරු පරපුරෙහි සමීපචාරීබව, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය යන සිව් පිළිසඹියාවන් ලැබීමට පුරුදු පුහුණු වන බව නම් පැහැදිලිය.

'ගුණ මිණි පවත' ශාසන ඉතිහාසයටම ආලෝකයෙකි. තෙරුවන් පිහිටෙන් සියලු දෙව් රැකවරණින් පූජ්‍ය දිගන සුගතවංස ස්වාමීන් වහන්සේට නිදුක් නිරෝගි සුව දිගාසිරි ලැබේවා! ඒ ස්වාමීන් වහන්සේගේ ධර්මඥාන, භාවනාඥාන අභිවර්ධනය වේවා! සම්බුදු සසුන බැබළවීමට ශක්තිය ලැබේවා!

'ගුණ මිණි පවත' කියවන ඔබට ශ්‍රද්ධාදි ගුණ පහල කරගෙන සසුන් බර ඉසිලීමට සුදුසු බව දියුණු කරගෙන එමඟින් පාරමී පුරා නිර්වාණාලෝකයෙන් ආලෝකවත් වීමට වහ වහා ලැබේවා'යි ආශිංසනය කරමි.

තෙරුවන් සරණයි!

මෙයට සසුන් ලැදි,

**පහලවිටියල ජනානන්ද මහා ස්ථවිර.**

‘නො සුලභෝපමා’ වදනක්........

ගුණ මිණි පවත නම් වූ මෙම කෘතියට ඇත්තේ අති පූජනීය අරමුණකි. ඒ කිමැයි, පෙරවදනින් හා ග්‍රන්ථයෙන් මනාව පැහැදිලි වෙයි. නිර්මල බුද්ධ ශාසනයේ පැවැත්මට අපිරිමිත මෙහෙවරක් සිදු කොට අපවත් වී වදාළ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක, අති ගරු පූජනීය, රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංස මහා සාමීන්ද්‍රයන් වහන්සේ ගේ බෝධිසත්ව චරිතය මෙයට මාතෘකාව වී ඇත. මෙය කෙතරම් පූජනීය අරමුණක් ද යනු දන්නෝ දැන ගනිති. නොදන්නෝ මෙවැනි කෘති වලින් දැන ගනිති. එද සම්බුදු සසුනේ චිර පැවැත්මට හේතුවකි.

මේ ගත් කතුවරයා ඒ මාහිමියන් වහන්සේ සිතු-පැතු වර්ගයේ ශිෂ්‍ය නමකි. පැවිදි ගුණ-නුවණින් පොහොසත් වෙමින් ඉදිරියට යන්නෙකි. නිවන බලා නිසි මග යන වාසනාවන්තයෙකැයි සිතමි. ඒ මාහිමි චරිතයෙන් සැනසුනු ජීවිත අපමණය ඒ චරිතය **‘නො සුලභෝපමා’** චරිතය කි. එවැන්නක් කාව්‍යට නැංවීම එහි රස-මිහිර සිය දහස් ගුණයෙන් ගුණ කිරීමකි. පහසු කාර්‍යයක් නොවේ. අපහසුම කාර්‍යයකි. එහෙත් මේ කතුවරයන් වහන්සේ ඒ බරපතල කටයුත්තට අත තබයි. තම සිතින් උනා-පෙරී පිටාරා ගලා යන ගුරුබැතිය මෙසේ ලියා දක්වයි. කළ ගුණ දත්-ගුණ හඳුනන සිසු දරුවෙකුගේ තරම මෙයින් පෙනී යයි.

ඒ ඉමහත් ගුරු බැතිය නිසා ම ඉතා ඉක්මණින් මෙය මුද්‍රණය කොට සැදැහැතියන් අතට පත් කිරීම කතුවරයාගේ අදහස ය. ඒ අදහස ඉටුවේවා. ඒ මේ සම්පහංසන කුශලය මේ ගත් කතු පූජ්‍ය දිගන සුගතවංස ස්වාමින්වහන්සෙට සුවිශද-සුවිශාර ධර්මඥාන සහ භාවනාඥාන පහල වීමට හේතුවේවා.

**මෙයට- හැවැන්පැලැස්සේ චන්දවංස ස්ථවිර,**
නාථගණේ
අරණ්‍යය,
මහකෙළිය.

**සංඥාපනය...........**

අපවත් වී වදාළ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක හා ප්‍රධාන අනුසාසක රාජකීය පණ්ඩිත අති පූජ්‍ය කඩවැද්දුව ශ්‍රී ජිනවංසාභිධාන නායක මාහිමිපාණන් වහන්සේගේ චරිතය සිහ ගන්වමින් පූජ්‍ය දිගන සුගතවංස ස්වාමින් වහන්සේ පාළි භාෂාවෙන් ගාථා පංතියක් ලියා ග්‍රන්ථයක් වශයෙන් එළි දැක්වීමට කටයුතු කිරීම සතුටට කරුණකි. තමන්ගේ දක්ෂකම, ඥාණාන්විත බව, භාෂා ඥාණය මෙයින් ප්‍රකටය.

අපවත් වී වදාළ අති පූජ්‍ය කඩවැද්දුව ශ්‍රී ජිනවංසාභිධාන මාහිමිපාණන් අති ශ්‍රේෂ්ඨ ගුණවත් උතුමෙකි. සියලුම දෙයින් පරිණත වූ අවංක, නිහතමානී, මනා දේහ සම්පත්තියක් ඇති, කළ පිං ඇති, පූරණ ලද පාරමී වාසනාව ඇති, දේශණයට හා ලේඛණයට හුරු පුරුදු මහා සංඝ පීතෘන් වහන්සේ නමකි. 1907. 04. 01 දින මාතර පුරවරේදී ජන්ම ලාභය ලබා වර්ෂ 1921 අගෝස්තු 21 දින උතුම් පැවිදි ජීවිතට ඇතුලත්ව 1927 ජුලි 03 දින උතුම් උපසම්පදාව ලැබූහ. දීර්ඝ කාලයක් රට පුරා ධර්ම දේශනා කළහ. 2500 සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව 1951 ජුනි මස 18 දින පොසොන් පුර පසළොස්වක දින ආරම්භ කරන ලදී. එම සංස්ථාව අද දක්වාම ඉතා සාර්ථකව වැඩ කටයුතු කරගෙන යෑම සතුටට කරුණකි. අති පූජ්‍ය මාහිමි පාණන් වහන්සේ විශාල සාසනික සේවයක් සිදු කොට වර්ෂ 2003 ජුලි මස 13 දින මනා සිහි නුවණින් අපවත් වූහ.

මෙම සියලු විස්තර ඇතුලත් කොට ඉතා මනෝහර මෙම ග්‍රන්ථය සකස්වී ඇත. පාළි ගාථාව සහ සිංහල අර්ථයද ඇතුලත් වී ඇත. අපවත් වී වදාළ මාහිමිපාණන් වහන්සේගේ චරිතය 'චරිත මධු' යන නමින් ග්‍රන්ථයක් ඇත. මෙය වනාහි පාළි ගාථා ග්‍රන්ථයකි. මෙවන් ග්‍රන්ථයක් සැකසීම අසීරු කරුණකි. එම අසීරු දෙය පූජ්‍ය ත්‍රිපිටකාචාර්ය දිගන සුගත වංස ස්වාමින් වහන්සේට හැකියාව ලැබිණ. උන් වහන්සේ ත්‍රිපිටක අධ්‍යාපනය

ලබා පාළි ව්‍යාකරණ පිළිබඳ හසල දැනුමක් ඇතිකර ගැනීමට ලැබීම විශේෂත්වයකි.

අපවත් වී වදාළ මාහිමිපාණන් වහන්සේ පිළිබඳව විශෙෂ ග්‍රන්ථයක් සකස් කිරීමට ඉතා උනන්දුනේ කටයුතු කළ පූජ්‍ය දිගන සුගතවංස ස්වාමීන් වහන්සේට මේ උතුම් පිං බලයෙන් තෙරුවන් සරණින් නිදුක් නිරෝගී සුව දිගාසිරි ලැබෙවා. තව තවත් උතුම් උතුම් ග්‍රන්ථ ප්‍රකාශයට පත් කිරීමට ද, ශාසනික ගුණ ධර්ම දියුණු කර ගැනීමට ද, ශක්තිය-බලය-ධෛර්‍ය ලැබේවායි ආශිර්වාද කරමි. අපවත් වී වදාළ අති පූජ්‍ය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංසාභිධාන නායක මාහිමිපාණන් වහන්සේගේ ශ්‍රී භාවටය පූජෝපහාරයක් ම වේවා. ඒ මාහිමිපාණන් වහනසේට උතුම් බුදුබ ලැබෙවායි පතමි.

වත්මන් ශ්‍රී කල්‍යානී යෝගාශ්‍රමාධිපති ප්‍රධාන අනුසාසක මහා කම්මට්ටානාචාර්‍ය අති පූජ්‍ය නා උයනේ අරියධම්මාභිධාන නායක මා හිමි පාණන් වහන්සේ ප්‍රධාන මහා සංඝ රත්නයට ද සෙත් මෙත් ප්‍රාර්ථනා කරමි.

මෙයට
කාරුණික
**කහගොල්ලේ සෝමවංස හිමි.**

ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමය
ගල්දූව- කහව
අම්බලන්ගොඩ
2012. 05. 10

## පූර්විකාව..........

මිනිස් සිත ලෝකයේ අසිරිමත් නිමැවුමකි. එහෙත් සිතේ ඇරඹුම කවදා කෙසේ විනිදැයි සෙවීම දුෂ්කර කටයුත්තකි. එය එසේ වුවද සිතක පැවැත්ම සහ නැවැත්ම සොයා ගත් සේක් නම් අප තිලෝගුරු බුදු පියාණන් වහන්සේ ම ය. සිතේ පැවැත්ම හඳුන්වාදෙන පාඩම ලෙස ගතහොත් චිත්ත නියාමයද, සිත් පෙළේ පැවැත්ම හඳුන්වා දෙන පාඩම ලෙස ගතහොත් භාවනාව යැයිද හඳුන්වා දිය හැක. සිතක ඇති සුන්දරත්වය නිසා නිමවන ආශ්චර්යමත් දෙයින් සමාජයට-පරිසරයට-ආර්ථිකයට-ආගමට-වන මහෝපකාරිත්වය අසන-දකින ඔබට දැකිය හැක්කේය.

සමාජයක් යනු නොයෙක් ගති පැවතුම් ඇති, හැසිරීම් ඇති, අදහස් උදහස් වලින් පිරුණු සත්ව පුද්ගල එකතුවකි. ඒ මේ සමාජය දිනෙන් දින ආර්ථික හා තාක්ෂණ වශයෙන් සීඝ්‍රලෙස දිගු ගමනක් පැමිණෙන අතර ඒ ඒ සතා සිව්පාවන්ගේ ඇතැම් ක්‍රියා කාරකම් වලින් වන මෙහෙයට වඩා සියදහස් ගුණයක් මිනිස් සතාගෙන් වන මෙහෙවර සිතිය යුතුමය. මේ සමාජයේ පැවැත්ම හා නැවැත්ම වෙනුවෙන් පවතින ජීවී-අජීවී සැම දෙයක් තුලම කාගේ කාගේත් සිත් ඇද ගන්නා ආශ්චර්යමත් දේ පවතී. කෙනෙක් තුල ආශ්චර්යමත් ගුණ, හැකියාවන් ඇති වන්නේ මේ ජීවිතයේ පුරුදු කල දෙයින් නොව අනාදිමත් සංසාරයෙහි භවයක් පාසා පුරුදු පුහුණු කල ගුණ ශක්තියක් මතය. ඒ ශක්තිය කර්ම ශක්තිය ලෙස බුදු දහමේ ඉගැන්වේ.

**“කම්මනා වත්තති ලොකො - කම්මනා වත්තති පජා,**
**කම්ම නිබන්ධනා සත්තා - රථස්සාණීව යායතො.**

මේ ලෝකයේ සියලු සත්වප්‍රජාව පවතින්නේ කර්මය හේතුවෙනි. ඔවුන්ගේ පැවැත්ම හා සම්බන්ධය කර්මය මත සිද්ධවේ. මෙලොව මනුෂ්‍යයෙක් වශයෙන් ප්‍රතිසන්ධි ලැබූ අවස්ථාවේදී සසර පුරුදු සමඟ පවතින නිසාවෙන් හා භවය අල්ලාගත් චිත්ත සන්තතිය සැබැවින්ම ප්‍රභාස්වරය. ඒ පැහැසර සිතින් සිතන කියන කරන දේත් පැහැසර බවට පත්වේ. ආගන්තුකව පැමිණෙන කෙළෙස් දූ රජස් නිසා වරෙක අපිරිසිදු

වූවත් ලැබෙන කුසලාරම්මණය හේතුවෙන් වරෙක පිරිසිදු කෙරෙත් ය. හොඳ හිතේ නිමැවුම පුදුම ආශ්චර්යකි.

**“විචිත්ත කරණා චිත්තං - අත්තනො චිත්තතාය වා,**
**චිතං කම්ම කිලෙසෙහි - චිතං තායති වා තථා,**
**චිනොති අත්ත සන්තානං - චිත්තංති පවුච්චති.”**

විසිතුරු කරන බැවින් ද, විසිතුරු දේ නිපදවන බැවින් ද, සිතය. බුදු සසුන පිහිට කරගෙන සිත විසිතුරු කරගත්, ඒ විසිතුරු සිතින් නිපදවූ දේ අතීතයේ වැඩසිටි උතුමන් වහන්සේලා ගේ චරිතාපදානයන් ගෙන් මනාව පිළිබිඹු කෙරේ.

**“සුතා ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා”** යන බහුශ්‍රැත නියායෙන් ඔපවත් වූ විසිතුරු සිතක නිමැවුමකි ශ්‍රී කල්‍යාණි යොගාශ්‍රම සංස්ථා නැමැති සසුන් මෙහෙවර. ඒ සත් කාර්යයේ නියමුවාණෝ දකුණු සිරිලක කඩවැද්දුව නම් ගම් පියසෙහි මෙලොව එළිය දුටු හොඳ අඳුරු පෙළපතකට නෑ කම් කියමින් සසුන් දිවියට පිළිපන් ප්‍රපූජ්‍ය පඬිවර ජිනවංස මහා යතිවරයාණෝ ය. ඒ කර්තෘනායකයන් ගේ විසිතුරු සිතේ නිමැවුම මනා සුරක්ෂිතව බෙහෝ කල් පවත්නට උරලය දෙමින් චිත්ත ශක්තිය දෙමින් මහෝපකාරී වූයේ රාජකීය පඬිවර මාතර සිරි ඤාණාරාම නා සමිඳාණෝ ය. එම සත්පුරුෂ යුග පුරුෂයන් දෙනම ගේ යොධ බල, යෝධ ශක්තියෙන් හා ධෛර්යයෙන් සමුත්පාදකත්ව ට පැමිණි සසුන් මෙහෙවර මහත් ආශ්චර්යකි.

ඒ ආශ්චර්යමත් ශ්‍රී. ක. යෝ. සංස්ථා නැමැති සාසන පුනරුදයේ ඉතිහාස ගත කරුණු සහිත සමුත්පාදක මාහිමි චරිත ගුණ එකතු කරමින් පාලි පද්‍ය මය නිර්මාණයක් කරන්න තරම් මා සමතෙක් නොවෙමි. පාලි පද්‍ය නිර්මාණය ඉගෙන ගනිමින් මා ගේ පෙරහුරුවක් ලෙස 2004 වැසි සමයෙහි සකස් කළ මේ නිබන්ධනය කියවූ කිහිප දෙනෙකුගේ අපේක්ෂාව වූයේ මෙය මුද්‍රණයක් ලෙස ඉදිරිපත් කිරීම යහපත් බවය. ඒ අතර ප්‍රපූජ්‍ය මීතලාවේ විනීත මාහිමි පාණන්ගේ උදාර කැපවීම හා අපවෙත

ලබාදුන් ධෛර්‍ය මත මෙය තව දුරටත් සකස්කර වසර 7 කට පසු මේ අයුරුන් එළිදකී.

මේ ග්‍රන්ථය තුල පාලි වචන ගැළපීම්-ඡන්දස් අලංකාර-පද සම්බන්ධ-ගුරු ලඝු යෙදීම් සහිත වෘත්ත යෙදීම් ආදී ගාථා බන්ධන කුසලතාවයන් ගෙන් නොදියුණු බැවින් මෙහි බොහෝ අඩු පාඩු තිබීම රහසක් නොවේ. මා මීට පෙර කුඩා ගාථා පද ගැළපීම් කර තිබුණත් මෙවැනි නිර්මාණයක් කළ පළමු අවස්ථාවයි. එබැවින් මෙහි යම් දෝශයක් ඇත්නම් ඒ සියලු වරද මා සතුය. සුධීහු අනුකම්පා කොට සදොස් තැන් බලා මෙත් කරුණාවෙන් මා වෙත දන්වා එවන ලෙස මා නිහතමානී වෙමි.

මේ සත් කාර්‍යයෙහි ලා නොමඳ උදව් උපකාර කල
සියලුම සත් පුරුෂයන් වහන්සේලා ටත්, ධර්ම දායකත්වය වෙනුවෙන් බරපැන යොදමින් උදව් උපකාර කල සියලු මව්-පිය-දූ-දරු සැම දෙනා ටත්, මිය පරලොව ගිය සියලු ඥාතීන් ටත්, දෙවියන් සහිත සදේවක ලෝකයා ටත් "සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා" යන ප්‍රතිපදා වෙන් අජරාමර නිවන් සුව සාක්ෂාත් වෙත්වා!

**"සබ්බෙ සත්තා භවන්තු සුඛිත මුදිතත්තා!"**

මෙයට මෙත් කරුණාවෙන්
කතු හිමි.



# විඤ්ඤාපනං

## අධිකාරො

1. පුබ්බධිකාර කුසලෙ පටිබිම්බරූපො-
වුබ්බංගමො ච සමථෙසු විපස්සනාසු,
ඤාණාදිරාම අති උත්තම ථෙර සාමි-
පුඤ්ඤෙදාන්තෙන මධිගච්ඡතු බුද්ධ ඤාණං.

2. කල්‍යාණි නාම වනවාස පරම්පරාය-
සම්පාදකො යතිපිතා ජිනවංස නාමො,
ථෙරො ජනුත්තමතරො තිදිවංගතො සො-
පුඤ්ඤෙදාන්තෙන මධිගච්ඡතු බොධි ඤාණං.

3. සෙසා දිවංගත විනායක පුජනීයා-
සංඝිස්සරා සුගරුගාරව ථෙරපාදා,
සම්මානුමොදිය මමග්ග මිමං සුපුණ්ණං-
ඛිප්පං ලභන්තු සිවමුත්තම සම්පදං තං.

## උපකාරානුස්සති

4. තස්සං සහායනුසභාපති කිත්ති ඝොසො-
නෙරුත්තනමො යතිවරො කරුණාධිවාසො,
ජනාදිනන්ද ඉති ආචරියාසභො මෙ-
පුඤ්ඤෙදාන්තෙන මධිගච්ඡතු බොධි ඤාණං.

5 තස්සාය කාරක සහාය නියුත්ත තුණො-
තෙපිටකෙසු පවරො මම ධම්ම නෙතා,
ථෙරොපි බොධිරතනො ගරුගාරවො සො-
පුඤ්ඤෙදාන්තෙන මධිගච්ඡතු බොධි ඤාණං.

## විඥාපනය

### ප්‍රාර්ථනාව

1. පුණ්‍යානුභාව මහිමයෙන් සෙස්සන් හික්මවීමේ දක්ෂ වූ සමත විපස්සනා භාවනාවන්හි මනාව භාවිත සිතැති අති උත්තම පූජනීය මාතර ඥාණාරාමාභිධාන මහා ථේරපාදයානන් වහන්සේ මෙවින් බෙලෙන් සම්බුද්ධ ඥාණය අවබෝධ කරත්වා!

2. ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම වනවාස පරම්පරාවෙහි නිර්මාතෘවර ජනයාට උතුම්ව වැඩ සිට අපවත් වීමෙන් පසු දෙව්ලොව වැඩි සංඝ පිතෘවර අති පූජනීය කඩවැද්දූවේ ශ්‍රී ජිනවංසාභිධාන මහා ථේරපාදයානන් වහන්සේ මෙවින් බෙලෙන් සම්බුද්ධ ඥාණය අවබෝධ කරත්වා!

3. සංස්ථානු බද්ධිතව සංඝයාට නායකව සිට අපවත්ව වදාළ සෙසු පූජනීය ගරු කටයුතු ථේරපාදයන් වහන්සේලා මා විසින් ග්‍රන්ථ රචනයෙන් ලබන ලද මෙවින් බෙලෙන් උතුම්වූ නිර්වාණ සම්පත්තිය වහා ලබත්වා!

### කළ උපකාර මෙනෙහි කිරීම

4. ශ්‍රී. ක. යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ උපසභාපති ධූරීන කරුණා ගුණයෙන් පිරිපුන් කීර්ති ඝෝෂා ඇති මාගේ ආචාර්‍යයෝත්තම අති පූජනීය පහල විටියල ඥානානන්දාභිධාන උත්තම යතිවරයන් වහනසේ මෙවින් බෙලෙන් උතුම් බෝධියකින් නිවනින් සැනසෙත්වා!

5. ශ්‍රී. ක. යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ සභාපති ධූරීන ත්‍රිපිටකයෙහි දක්ෂ මාගේ ආචාර්‍යයෝත්තම අති පූජනීය ගරු කටයුතු රහතුන්ගොඩ බෝධිරතනාභිධාන උත්තම යතිවරයන් වහනසේ මෙවින් බෙලෙන් උතුම් බෝධියකින් නිවනින් සැනසෙත්වා!

6. තස්සං සභාය පරියත්ති සභාපතීව-
සුත්තාභිධම්ම විනයෙසු මමාභිනෙතා,
ථෙරො විනීත ඉති පත්ථට කිත්ති ඝොසො-
පුඤ්ඤොදයා’තෙන මධිගච්ජතු බොධි ඤාණං.

7. තස්සං සභාය පරියත්ති සුලෙඛකො යො-
නෙරුත්තිකොව පවරො මම ධම්ම නෙතා,
සො වනද්වංස ඉති විස්සුත ථෙර පාදො-
පුඤ්ඤොදයා’තෙන මධිගච්ජතු බොධි ඤාණං.

8. තස්සාය කාරක සභාය නියුත්ත තුනො-
සද්ධම්මකොවිද යති මම ධම්මනෙතා,
සොමාදිනන්ද ඉති පත්ථට ථෙරසාමි-
පුඤ්ඤොදයා’තෙන මධිගච්ජතු බොධි ඤාණං.

9. තස්සාය කාරක සභාය නියුත්ත තුනො-
සද්ධම්ම දෙසක යති මම ධම්ම නෙතා,
සද්ධාදිසුමන ඉති විස්සුත ථෙරපාදො-
පුඤ්ඤොදයා’තෙන මධිගච්ජතු බොධි ඤාණං.

10. තස්සං සභාය අතිරේකක ලෙඛකොයො-
ථෙරො විචිත්ත කථිකො මම ධම්ම නෙතා,
සො සොමවංස ඉති සංඝ සභායකොතු-
පුඤ්ඤොදයා තෙන මධිගච්ජතු බොධි ඤාණං.

6. ශ්‍රී. ක. යෝගාශ්‍රම සංස්ථා පරියත්ති සංඝ සභාවේ සභාපති ධූරීන ත්‍රිපිටකයෙහි දක්ෂ පැතිරුණු කීර්ති ඝෝෂා ඇති මාගේ ආචාර්යයෝත්තම අති පූජනීය මීතලාවේ විජිතාභිධාන උත්තම යතිවරයන් වහනසේ මෙපින් බෙලෙන් උතුම් බෝධියකින් නිවනින් සැනසෙත්වා!

7. ශ්‍රී. ක. යෝගාශ්‍රම සංස්ථා පරියත්ති සංඝ සභාවේ ලේඛකාධිකාරී ධූරීන ත්‍රිපිටකයෙහි දක්ෂ පැතිරුණු කීර්ති ඝෝෂා ඇති මාගේ ආචාර්යයෝත්තම අති පූජනීය හැවැත්තැලැස්සේ චන්දවංසාභිධාන උත්තම යතිවරයන් වහනසේ මෙපින් බෙලෙන් උතුම් බෝධියකින් නිවනින් සැනසෙත්වා!

8. ශ්‍රී. ක. යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ කාරක සංඝ සභික ත්‍රිපිටකය ඉගැන්වීමෙහි දක්ෂ පැතිරුණු කීර්ති ඝෝෂා ඇති මාගේ ආචාර්යයෝත්තම අති පූජනීය වැවේගෙදර සෝමානන්දාභිධාන උත්තම යතිවරයන් වහනසේ මෙපින් බෙලෙන් උතුම් බෝධියකින් නිවනින් සැනසෙත්වා!

9. ශ්‍රී. ක. යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ කාරක සංඝ සභික සද්ධර්ම දේශනාවෙහි දක්ෂ පැතිරුණු කීර්ති ඝෝෂා ඇති මාගේ ආචාර්යයෝත්තම අති පූජනීය ඇකිරියේ සද්ධාසුමනාභිධාන උත්තම යතිවරයන් වහනසේ මෙපින් බෙලෙන් උතුම් බෝධියකින් නිවනින් සැනසෙත්වා!

10. ශ්‍රී. ක. යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ උප ලේඛක ධර්ම කාමී විචිත්‍ර ධරම කථික සංඝයාට සහායක වූ මාගේ ආචාර්යයෝත්තම අති පූජනීය කහගොල්ලේ සෝමවංසාභිධාන උත්තම යතිවරයන් වහනසේ මෙපින් බෙලෙන් උතුම් බෝධියකින් නිවනින් සැනසෙත්වා!

11. අප්පිච්ඡතාදි ගුණ තුසිත තුසිතො සො-
නිබ්බාන මග්ග උපදෙසක ථෙර පාදො,
ඤාතා ච මෙ අරියනාද සුකිත්තිඝොසො-
පුඤ්ඤොදත්තෙන මධිගච්ඡතු බොධි ඤාණං

12. කල්‍යාණී නාම වනවාස පරම්පරාය-
කල්‍යාණ මිත්ත පරමා අවසෙස ථෙරා,
පච්චූපකාර හිත සිද්ධි රතෙහි සද්ධිං-
සිප්පං ලභන්තු සිව සම්පද මග්ග මග්ගං.

දිගන සුගතවංස භික්ඛු



11. අල්පේච්ඡතාදි ගුණාභරණයෙන් බැබළුණු නිර්වාණ මාර්ගයට උපදේශක වූ කීර්ති ඝොෂා ඇති මාගේ ආචාර්යයෝත්තම අති පූජනීය අඟුල්ගමුවේ අරියනන්දාභිධාන උත්තම යතිවරයන් වහන්සේ මෙවින් බෙලෙන් උතුම් බෝධියකින් නිවනින් සැනසෙත්වා!

12. ශ්‍රී. ක. යෝගාශ්‍රම වනවාස පරම්පරාවෙහි උතුම් වූ කල්‍යාණ මිත්‍ර අවශේෂ තෙරුන් වහන්සේලාද උදව් උපකාර කල හිතමිත්‍ර ජනයා සමඟ උතුම් වූ නිර්වාණ මාර්ගය වහා ලබත්වා!

දිගන සුගතවංස භික්ෂු



නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!!!

## 01. රතනත්තයාභිවන්දනා

01. තිභුවන තිලකං යං ධම්ම රාජං මුනින්දං-
සුතිණ්ණ මතිධාරිං ජන්තූනං අග්ගදීපං,
පවර සිරි සරීරං රංසිජාලා'භිකිණ්ණං-
අසමසමම'හං* තං බුද්ධ භානුං නමාමි[1].

02. වරතර මහිසන්තිං ජන්තුකානං දදන්තං-
මධුර මධු සමානං සොතූනං සබ්බ කාලෙ,
විවිධ නය විචිත්තං නෙක විඤ්ඤුප්පසත්ථං-
දසබල පටි සෙවිං ධම්ම වන්දං නමාමි.

03. සුගතවරපසත්ථෙ අඤ්ජසෙ ජොතයන්තං-
කුමති තිමිර ජාලං සබ්බදා ධංසයන්තං,
සමිත විමල ජීවිං ධම්ම වන්දෙ භමන්තං-
ත'මරිය'මභි* සඞ්ඝං තාරසඞ්ඝං නමාමි.

සාධු! සාධු! සාධු!

---

* න + සම = අකාරාදේශ වීමෙන් අසම
අසමස්සසමෝ = අසමසම
අසමසමං + අහං = අසමසමහං (නිග්ගහීතයට මකාරාදේශ වේ.)

* තං + අරියං + අභිසඞ්ඝං
තමරියමභිසඞ්ඝං (නිග්ගහීතයන්ට මකාරාදේශ වීමෙනි.)

ඒ භාග්‍යවත් වූ අරිහත් වූ සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේට
මාගේ නමස්කාරය වේවා!!!

## 01. රතනත්‍රයාභි වන්දනය

01. තිලොවට තිලක වූ, මුනේන්ද්‍ර ධර්මරාජ වූ, මහා තීක්ෂණනුවණින් සමන්වාගත වූ , සතනගේ (සන්තාන තුලට) අග්‍ර දීපයක් වූ, නීල පීතාදී රංසි ජාලාවන් ගෙන් ගැවසීගත් උත්තරීතර ශ්‍රී දේහ සම්පත්තියකින් සමන්වාගත වූ, සූර්යයාබඳු අසම සම ගුණැති සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

02. සත්ව සන්තානයන්ට උතුම් නිර්වාණ ශාන්ති දායක වූ, සියලු කල්හි අසන්නන්ට මධුර මිහිරි වූ, විවිධ විසිතුරු නය ක්‍රම ඇති නොයෙක් ඥානවන්තයන්ගෙන් ප්‍රශංශාලත් දසබලධාරීන් වහන්සේ විසින් සේවනය කරන ලද චන්ද්‍රයා මෙන් බැබලෙන ශ්‍රී සද්ධර්ම රත්නයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

03. සුගතයන් වහන්සේ විසින් ප්‍රශංශිත (ධර්ම) මාර්ගයෙහි බැබලෙන්න වූ, ඝන (මෝහ) අන්ධකාරය සහිත සියල්ල සැමදා දුරු කරන්නාවූ, පව් සමනය කල කෙලෙස් මල වැමැරූ දහම් සඳුවටා මනාව භ්‍රමණය වන්නාවූ, ඒ ආර්ය මහා සඞ්ඝ රත්නය පහන් තාරකා සේ ලොව බැබලූ සේක. එසේ බැබලූ ඒ ආර්ය මහා සඞ්ඝ රත්නයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු! සාධු!

04\. විකසිත සතපත්තං’වාසිතං දස්සනීයං-
විය ඉහ සිරිලඞ්කා ථේරවංසේක කේතුං,
අතිගරු ජිනවංසත්ථේර සාමින්දබද්ධං,
සුචරිතමපදානං* සාධයිස්සං සුභත්‍යා.

## 02 පවෙසනද්වාරං

05\. අනවතත්ථ නාමං පරිපොසිතස්ස-
සාමිස්ස මෙතං ජිනවංස චාරං,
සබ්බෙ නිසාමෙන්තු පසන්න චිත්තා-
සබ්බෙපි හොන්තා වරසන්තිකාමා.

06\. යො ආසි සෙට්ඨො කඩවැඳුවසමිං-
ලොකං ජලන්තො ගුණ කොමුදීහි,
ථේරස්ස තං’හං* සමනුස්සරන්තො-
ථේරාපදානං පදුමාරභිස්සං.

07\. පුබ්බෙ නිබද්ධානි ගරුං කරිත්වා-
අජ්ජාපි රත්තඤ්ඤු මතිං ගහෙත්වා,
එවංමිදං පාලිනයානු රූපං-
සො’හ’මපි පජ්ජෙහි ගුණේ රචිස්සං.

08\. තස්මාහි ගන්ථොගධයං අයොගගං-
තං වජ්ජයිත්වාන පමාදලෙඛං-
තං සාමි පාදස්ස ගුණප්පවාහං,
නත්වාන මුද්ධෙන අහං ලිඛිස්සං.

---

* සුචරිතං + අපදානං
* තං + අහං = තංහං

04. සුවඳ කවන ලද ප්‍රිය පද්මයක් මෙන් දර්ශනීය වූද, ශ්‍රී ලංකා ථේරවංස පරම්පරාවේ ධර්මද්වජයක් මෙන් (වැඩසිටි) අතිගරු ජිනවංස ථේරපාදයන් වහන්සේහා බැඳුනු පිරිසිදු චරිතාපදානය (භක්ත්‍යාදරයෙන්) මෙසේ මා සකස්කරන්නෙමි.

## 02. පිවිසුම් දොරටුව

05. අන්වර්ත නමකින් පරිපෝෂිත ජනවංස ස්වාමිපාදයන් වහනසේගේ සාධු හැසිරීම ප්‍රසන්න සිත් ඇත්තාවූ නිර්වාණ ශාන්තිය කැමති වන්නාවූ සියලු පින්වත්හු මනාව අසන සේක්වා!

06. කඩවැද්දුව ගමෙහි උපන්නාවූ යම් ශ්‍රේෂ්ඨයන් වහන්සේ නමක්වීද, හෙතෙමේ ගුණ දහරින් ලොව දල්වමින්, එසේ ලෝතෙත් කළ ථේරපාදයන් වහන්සේගේ ගුණ අනුස්මරණය කරමින් ථේරාපදාන නම්වූ පද්මය මම ආරම්භ කරන්නෙමි.

07. පෙර ලියන ලද තෙර ගුණ ගුරු කොට ගෙනද ඒ බැඳුම් වලට වත්මන් ගුරු උතුමන්ගේ අදහස්ද ගෙන මෙසේ ථේරාපදානය පාලි නය ක්‍රමයට අනුව ඒ මම පද්‍ය වලින් මෙසේ රචනා කරන්නෙමි.

08. එබැවින් වනාහි පුරාණ ග්‍රන්ථ ගත විස්තර අතුරෙන් ප්‍රමාදව ලියවුණු ඒ අර්ථ දුරුකොට ථේරපාදයානන් වහන්සේගේ ගුණ කීර්තිමත් ඒ ප්‍රබන්ධය උන්වහන්සේට සිරසින් නමස්කාරකොට මා ලියන්නෙමි.

## 03. ලංකා වාසීනං ධම්ම රස කාලො

09. සබ්බං අනිච්චං අථ දුක්ඛනත්තං-
නිබ්බාන ධම්මං පන නිච්ච ධම්මං,
එවංවිදං සබ්බ තථාගතා හි-
සම්මා පවෙදෙන්ති මහා දයාය.

10. සම්බුද්ධචන්දෙන තථාගතෙන-
තං දෙසිතං ධම්ම වරං ගහෙත්වා,
ථෙරො මහින්දාච’වසෙස* ථෙරා-
සම්පාපුණිංසු ඉහ ජම්බුදීපා.

11. තිස්සොපි දෙවාන පියො නරින්දා-
කාසාව වණ්ණෙහි නිවත්ථ වත්ථෙ,
පස්සිත්ව ඛීණාසව බුද්ධ පුත්තෙ-
පසාදමාපජ්ජි ජනෙහි සද්ධිං.

12. තස්මිං තදා මිස්සක පබ්බතස්මිං-
තං දෙසිතං ධම්ම රසං සුණිත්වා,
පුබ්බෙව රාජා සුමනො අහොසි-
සෙසා මනුස්සාච තථෙව හෙසුං.

13. ජාතොත්‍ර සො සීහළ රාජ වංසෙ-
රට්ඨංච පාලෙසි සධම්ම යුත්තො,
ථෙරෙහි සද්ධිං සුසමාගමිත්වා-
සද්ධම්ම භූමිං අකරි සභූමි.

* මහින්දාච + අවසෙස = මහින්දාචවසෙස

## 03. සිරිලක බොදුනට දහම් අමාව

09. හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් සියල්ල අනිත්‍ය දුක්ඛ අනාත්ම යැයිද, නිර්වාණ ධර්මය නිත්‍යය ධර්මයැයිද, මෙසේ මෙය සියළු තථාගතයන් වනාහී මහත් අනුකම්පාවෙන් මනාව දේශනා කරත්.

10. සඳු මෙන් ලොව පහන් කළ තථාගත සම්බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද උතුම් වූ ශ්‍රී සද්ධර්මය ගෙන අනුබුදු මිහිඳු මහ තෙරුන් වහන්සේ ද අවශෙෂ වූ ඉට්ඨීය උත්තියාදී තෙරුන් වහන්සේලාද දඹදිවින් ලක් මිහිකත වෙත පැමිණියාහ.

11. දේවානම්පියතිස්ස මහරජතෙමේ කසාවත් වර්ණයන්ගෙන් හැඳ පෙරව සිටි ඛීණාශ්‍රව බුද්ධ පුත්‍රයන් වහන්සේලා දැක පිරිවර ජනයා සමඟ ප්‍රසාදයට පැමිණියේය.

12. එකල්හි මිස්සක නම්වූ ආරාධනා පර්වතයෙහි දේශිත ඒ ධර්ම රසය අසා ඉන් පළමුවම මහරජතෙමේ යහපත් සිත් ඇත්තෙක් විය. රැසවසිටි සෙසු මනුස්සයෝද එසේම යහපත් වූහ.

13. සිංහල රාජ කුලයෙහි උපන්නාවූ සද්ධර්මයෙන් යුක්තවූ හෙතෙමේ රටද පාලනය කලේය. තවද, තෙරුන් වහනසේලා සමඟ මනාව එකට එකතු වී මෙම භූමිය සද්ධර්ම භූමියක් කලේය.

14. තං සාසනං ජෝතයිතුං චිරස්සං-
පබ්බාජයුං සීහල පුත්තධීතා,
තෙසං අරිට්ඨෝ අභිධාන මෙච්චා-
සබ්බං විනා සාසන මොතරෙසි.

15. බුද්ධස්ස පච්ඡා තු චතුත්ථ නාමං-
සංගීතිකං සීහල සෙට්ඨ දෙසෙ,
සංගායනං කංසු අරිට්ඨ ආදි-
ථෙරා තතො තං සුචිරං පතිට්ඨී.

16. ඛීණාසවා’පි සත පඤ්ච මත්තා-
ආලොක ලෙනෙ ජින ධම්ම පාලිං,
ගන්ථෙසු සණ්ඨාන මකංසු සම්මා-
තස්මාපි ධම්මං සුචිරං අහොසි.

17. ඉච්චෙව මච්චන්ත සුධීර ලංකා-
ථෙරා ච සංගීති ඡයං අකංසු,
සබ්බම්පි තෙ පඤ්ච පටිච්ච මෙවං-
දීඝං විරොචී ජිනසාසනං තං.

18. දීඝ’ච්චයෙනාපි මිලක්ඛකෙහි-
තං බුද්ධ ධම්මම්පි විනාසයිංසු,
ජාතාපි වීරා අවිදූර’තීතෙ-
සම්පොසයිංසු පුනසාසනං තං.

14. ඒ සම්බුදු සසුන බොහෝකාලයක් බැබලවීම සඳහා සීහල පුත්‍රදීතෘ වරු සාසනයෙහි පැවිදි වූහ. ඔවුන් අතුරෙන් අරිට්ඨ නම් වූ අමාත්‍ය තුමාද සියල්ල අතහැර ශාසනයට බැසගත්තේය.

15. බුදුරජාණන් වහන්සේගේ ඇවෑමෙන් සතර වන වරට කළ සංගීතිකාව සීහළ නම් වූ ශ්‍රේෂ්ඨ දේශයෙහි අරිට්ඨ ආදී තෙරුන් වහන්සේලා සංගායනා කළහ. ඒ හේතුවෙන් බුදු සසුන බොහෝ කාලයක් මුල් බැස ගනිමින් පිහිටියේය.

16. පන්සීයක් පමණ වූ ඒ ක්ෂීණාස්‍රවයන් වහන්සේලා (මාතලේ) අලු විහාර ලෙනෙහි (එකතුව) ජින ධර්ම පාලිය නම් වූ තථාගත ත්‍රිපිටක බුද්ධ වචනය ග්‍රන්ථයන්හි මනාව සටහන් කළහ. එබැවින්ද ශ්‍රී සද්ධර්මය බොහෝ කාලයක් පිහිටියේ විය.

17. මෙපමණකින්ම ලංකාවාසී ඥානවන්ත තෙරුන් වහන්සේලා සංගායනා දෙකක් කළහ. ඒ සියලුම සංගායනා පස නිසා මෙසේ ඒ ජින සාසනය දීර්ඝ කාලයක් බැබලුනේ විය.

18. දීර්ඝ කාලයක ඇවෑමෙන් ද මිලේච්ඡ ආගම ජාතිවාදිකයන්ගෙන්ද මේ බුදු දහම විනාශ වූහ. නොදුරු අතීතයෙහි උපන්නාවූ වීර්යයන් වහන්සේලා නැවතත් ඒ ජින සාසනය මනාව පෝෂණය කළහ.

☸ ☸ ☸ ☸ ☸ ☸ ☸

## 04. සමාරමහිත නිකායත්තය

19. ධාතමහිතං නාම සුජම්බුදීපෙ-
උප්පජ්ජි ධම්මං පදුමං විචිත්තං,
පච්චන්ත දෙසෙසුපි තස්ස ගන්ධං-
සායිංසු නානා ජනතා සුසන්තා.

20. ඵුල්ලං'ව ආකිණ්ණ සුපුප්ඵ ගන්ධං-
රුක්ඛං යථා තං සුගතස්ස ධම්මං,
සුසාර සම්මූල තරුං සමානං- උපෙ
ලංකාම්මායං සුපතිට්ඨී සීසං.[2]

21. මිච්ඡත්ත දිට්ඨීච මිලක්ඛකෙ ච-
විදෙස දෙසෙසු අරීච හෙතු,
නිස්සාය බුද්ධස්ස සුධම්ම දීපං-
අත්ථංගතා හොසි අනුක්කමෙන.[3]

22. කිත්තිස්සිරි රාජ සීහස්ස රාජ-
කාලෙ සුධීරො සරණංකරව්හො,
සියාම නාමෙන විසොධයිත්වා- උපෙ
තං සාසනං නෙසි සුනිම්මලත්ථං.[4] උපෙ

23. අථොපි සොවණ්ණ පුරං ගමිත්වා- උපෙ
සම්මාදි සීලං අමරව්හදෙසා,
භදන්ත ඤාණො විමලොති සාමි-
ආණෙත්ව සොදෙසි ච සාසනං'තං.

24. ද්වෙ නිකායෙ අකරිංසු යෙ තෙ- උපෙ
සෙට්ඨා යතින්දා සගණා සුධීරා,
තෙවාපි තං සාසන වුද්ධිකාරා-
අඤ්ඤද ච මය්හං ගරුභාවනීය!

## 04. සමාරම්භිත නිකායත්‍රය

19. ජම්බුද්වීප නම් වූ පොකුණෙහි ධර්මය නම් වූ විචිත්‍ර පද්මයක් පහළ වූයේය. ඒ පද්ම ගන්ධයාගේ දහම් සුවඳ ප්‍රත්‍යයන්ත දේශයන්හි සාන්ත වූ සිත් ඇති නොයෙක් ජන සමූහයා නුවණින් ආග්‍රාහනය කළහ.

20. පිපී ගැවසී ගියාවූ මනාව මල් සුවඳ ගැවසීගත් ගසක් යම් සේද, එසේම සුගතයන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය සාරවත් මුල් බැසගත් ගසක් මෙන් මේ ලක් දෙරණෙහි ඉක්මනින් මනාව පිහිටියේය.

21. මිථ්‍යා බවට ගිය දෘශ්ඨි ඇති, ම්ලේච්ඡ ආගම් ජාතිවාදීන් ද විදේශ දේශයන්හි සතුරන්ද යන හේතූන් නිසා චනාභි බුදුරජාණන් වහන්සේගේ සුධර්ම ප්‍රදීපය අනුපිළිවෙළින් ලක් දෙරණින් අතුරුදහන් විය.

22. පිංවත් කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයෙහි ඥාණවන්ත වූ සරණංකර නම් වූ තෙරුන් වහන්සේ විසින් සියම් නමින් සාසන සෝධනය කොට පිරිසිදු නිර්මල බවට පැමිණවිය.

23. ඉන්පසුද භදන්ත ඥානවිමල ස්වාමින්වහන්සේ සුවණ්ණ දේශයට ගොස් අමරපුර දේශයෙන් මනාව අධිසීලය ගෙනවිත් ද, ඒ බුද්ධ සාසනය සෝධනය කළේය.

24. යම් ඒ යතිවරයන් වහනේස්ලා සියම් අමරපුර යන උභය නිකායන් කළාහුද, ඒ ශ්‍රේෂ්ඨ යතීන්ද්‍ර ඥානවන්ත පිරිවර සහිත බුද්ධ සාසන අභිවෘද්ධි කාමී වූ උන්වහන්සේලාද, අන්‍ය අනුගාමිකයෝද, මාගේ ගරුභාවනීයට සුදුසු විය.

25. අකම්මනෙ ජාත සුපුඤ්ඤවන්තො-
දිස්වාන සංසෙ පරිහානි මග්ගං, උපෙ
රාමඤ්ඤදෙසාහට සුද්ධසීලො-
රාමඤ්ඤ වංසං පටිපාදයී සො. ෴ උපෙ

### 05. රාමඤ්ඤ නිකායෙන සද්ධිං භික්ඛු පරම්පරා

26. තස්මිං නිකායෙ මහුපජ්ඣ භාවං-
ථෙරො සුමිත්තො පරිසොභයී සො,
තස්මිං සමුප්පාදක සෙට්ඨ ධුරං-
ඉන්දාසභො නායක සාමි පත්තො. ෴

27. ආසී තතො දුතිය නායක ථෙර සීලක්-
ඛන්ධාති විස්සුත මහා ගුණ භූසිතත්තො,
තස්මා පරං තතිය නායක භාව පත්තො-
ථෙරො අහොසි පවරො විමලාදිනන්දො. ෴

28. තස්සච්චයෙන පටිලද්ධ චතුත්ථ වාරෙ-
ඤාණින්ද නායක යතී පවරොසි තත්‍ර,
තස්මා පරං තු උපසෙන මහා යතින්දො-
ආසී ච පඤ්චම මහා ගණනෙතු ඨානං. ෴

29. තස්සච්චයෙන ගරු ජට්ඨම නෙතු භාවං-
පත්තාසි එත්ථ පවරො යති ධම්ම සිද්ධි,
තස්මා පරං අභවි සත්තම වාර මත්ත-
ථෙරාසභො යතිවරො ගරු ඉන්ද සාරො. ෴

25. අක්මීමන ගමෙහි උපන්නාවූ යම් ඥාණවන්ත පුරුෂයෙක් තෙමේ නිකාය ද්වයෙහි අඩුරු බව දැක රාමඤ්ඤ දේශයෙන් මනාව ලබන ලද අධිසීල සංඛ්‍යාත උතුම් සීලය ඇතිව හෙතෙමේ දකුණු සිරිලකෙහි බුදු සසුන පිහිටුවේය.

## 05. රාමඤ්ඤ නිකාය සහ භික්ෂු පරම්පරාව

26. ඒ රාමඤ්ඤ මහා නිකායෙහි මහෝපාධ්‍යාය භාවයට පත්ව හාත්පසින් බැබළෙන්නාවූ හෙතෙමේ පුවක්දණ්ඩාවේ සුමිත්ත මහතෙරුන් වහන්සේය. එම නිකායෙහි සමුප්පාදක ශ්‍රේෂ්ඨ ධූරයට පැමිණි අඹගහවත්තේ ඉන්ද්‍රාසභ ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රථම මහා නායක විය.

27. ඉන් අනතුරුව දෙවන මහා නායක තෙරුන් ලෙස පැතිරුණු මහා ගුණයන් ගෙන් යුත් පූජනීය දීපේගොඩ සීලක්ඛන්ධ නායක තෙරණුවෝ විය. ඉන් අනතුරුව තෙවන මහා නායක බවට පැමිණියේ ඔබඩ කන්දේ විමලානන්ද මහා තෙරුන් වහන්සේ විය.

28. ඉන් අනතුරුව එම නිකායෙහි සතර වන මහා නායක පදවිය ලබන ලද්දේ මාතර ඥාණින්දාසභ මහා යතියරයන් වහන්සේ විය. ඉන් අනතුරුව පූජනීය කෝදාගොඩ උපසේන මහා යතීන්ද්‍රයන් වහන්සේ පස්වන මහා නායක බවට පත් විය.

29. ඉන් අනතුරුව තත් නිකායේ හයවන මහා නායක පදවියට පැමිණියේ මාතලේ ධම්ම සිද්ධි යතිවරයන් වහන්සේ ය. ඉන් පසු එහිම සත්වන මහා නායක ලෙස පත් වූයේ කරතොට ඉන්දසාර මහා යතිවර ථේරාසභයන් වහන්සේ ය.

30. තස්සච්චයෙන යති නායක අට්ඨමො යො-
ඤාණොදයොසි පරියත්ති විසාරදො සො,
තස්සච්චයෙන නවමො යති නායකත්තං-
පත්තොසි ඡන්ද විමලව්හය ථෙර සාමි.

31. තස්මා පරං දසම නායක සෙට්ඨ ඨානං-
සම්පාපුණී පවර උත්තර නන්ද සාමි,
තම්හා පරෙක දසමො ගරු නෙතු ඨානං-
පඤ්ඤාදිසාර ථවිරො පරිසොභයීච.

32. සම්බුද්ධ සාසන වරස්ස පතිට්ඨ භූත-
රාමඤ්ඤ වංස වර ථෙර පරම්පරාය,
අනෙකාගධො ගරුතරො චිර රත්ත මෙධා-
ලංකාර සාමි පණිධානි හවෙය්‍ය නෙතා.

33. මෙධා අලංකාර හි නායකෙන-
ථෙරෙන සද්ධිං අවසෙස ථෙරා,
සොමංච රාමඤ්ඤච යථා නිකායං-
ධම්මං පහං ජොතයන්තු චිරස්සං.

## 06. රොහණතො ජාත වීරොධරා

34. යථා ජොතමානෙ පදීපෙ නහෙතෙ-
සුපට්ඨාය’තීතෙ හවිංසු තථෙවං,
සුවංසානු වංසෙන වීරොධරා තෙ-
සුජාතා බහූ රොහණෙ දෙස හෙසුං.[5]

30. ඉන් අනතුරුව අටවන මහා නායකයන් වහන්සේ ලෙස පත් වූයේ පරියත්ති විසාරද පූජනීය හිස්සැල්ලේ ඤාණෝදය යතිවරයන් වහනසේ ය. උන්වහන්සේගේ ඇවෑමෙන් නමවැනි මහා නායකත්වයට පත් වූයේ දීපේගොඩ චන්දවිමල ථේරපාදයන් වහන්සේ ය.

31. ඉන් අනතුරුව දසවැනි මහා නායක ශ්‍රේෂ්ඨ ස්ථානය වෙත උත්තරීතර ඉඳුරුවේ උත්තරානන්ද නායක ස්වාමීන්ද්‍රයන් පැමිණියේ ය. ඉන් අනතුරුව එකොළොස්වැනි මහා නායක පදවියට පැමිණ බැබළුණේ පූජනීය පොත්තේවෙල පඤ්ඤාසාර යතිවරයන් වහන්සේ ය.

32. උතුම් සම්බුද්ධ සාසනයට ප්‍රතිෂ්ඨාපිත වූ රාමඤ්ඤවංස ථේර පරම්පරාවට ඇතුලත්ව අද දක්වාම මහා නායක නේතෘත්වයෙන් පිදුමලත් පැවිදි ජීවිතයෙන් බොහෝ රාත්‍රී ගණන් ඉක්මවූ චිර රත්ත බවින් යුත් පූජනීය වේවැල්දෙණියේ මේධාලංකාර මහා සාමීන්ද්‍රයන් වහන්සේ වන්නේය.

33. වත්මන් නායක වූ අතිගරු වේවැල්දෙණියේ මේධාලංකාර නායක මාහිමියන් සමග අවසෙස මහා තෙරුන් වහන්සෙලා සඳුගේ ආලෝකය යම් සේද එපරිද්දෙන්ම රාමඤ්ඤ නිකාය නම් වූ ධර්ම ප්‍රභාවය බොහෝ කලක් බබළත්වා!

## 06. රුහුණින් දායාද කළ යුග පුරුෂයන්

34. අහසේ බැබළෙන පහන් තාරකාවන් යම්සේ ද එපරිද්දෙන්ම අතීතයේ පටන් ඒ වීරෝධාර උත්තමයෝ වංස පරම්පරාවෙ-න් ලොව බබුළුවන්නාහු වෙත් නම් ඒ වෙනුවෙන්ම රෝහණ දේශයෙහිම බොහෝ වීර වරු මනාව පහළ වූවාහුය.

35. සුමාගම්පි වංසස්ස අනෙකාධකානං-
දුවෙ පුග්ගලා ධම්මකාමා අහෙසුං,
ජිනොවංස ථෙරොච ඤාණාදිරාමො-
යතී රාජ හංසාව ඛෙත්තෙ අහෙසුං.

36. සුසම්භාර භූතා පසත්ථා ජනානං-
තු කාලංකතා බොධිසත්තා'පි ථෙරා,
සමූහං යතීනඤ්ච නෙතා'ව හුත්වා-
නභායිංසු සද්ධම්ම රංසීහි ලොකං.

37. පුරෙ මාගමෙ ජාත වීරා සුධීරා-
පවිත්තා පසන්නා'පි සම්පත්ති කායා,
සුව්‍යත්තක තෙ බුද්ධිජෙකා සුථාමා-
නනු තෙ සුබද්ධක මිත්තා අහෙසුං.

38. ගුණානං ගරූනං සසත්තප්පජානං-
ලතා වංස වණ්ණා මණී භික්ඛු වංසෙ ,
ජිනොවංස ථෙරො ච සද්ධම්ම කාමො-
නනු රොහණෙ ආසි ඤාණාදිරාමො.

## 07. ගුණ ගන්ධ පුප්ඵිත සුගන්ධ පුප්ඵං

(i) පඨම පාද වාරො

39. ලඞ්කාය දීප කඩවැඳුව ගාම ඛෙත්තෙ-
සබ්බෙපි සො වරමතී'ව පබොධයන්තො,
ජාතොව පඞ්කජවරො ගුණ ගන්ධ භූතො-
පී. ඩී. දිනෙෂ්ති විකසී සුචිරං විභෙතුං.[6]

35. මාගම් පුර වංස පරම්පරාවට ඇතුලත්වූ වීරෝධරයන් අතුරෙන් ධර්මකාමී වූ පුද්ගලයෝ දෙදෙනෙක් වූහ. නමින් ජිනවංස මහා තෙරුන් වහන්සෙ හා ඤාණාරාම මහතෙරුන් වහන්සෙ යන මහා යතිවරයන් වහන්සෙලා රාජ හංසයෝ මෙන් සසුන් කෙතේ දීප්තිමත් වූහ.

36. මහා ගුණ සම්භාරයක් ඇත්තාවූ ජනයාගෙන් ප්‍රශංසා ලබන ලද යතිවරයන්ගේ සමූහයට නායකයෝ වී සිට අපවත්වී වදාළ බෝධිසත්ව වූ ඒ තෙරුන් වහන්සෙලා දෙනම සදහම් රැස් දහරින් ලොව නැහැවූහ.

37. ඔවුහු නම් මාගම් පුරයෙහි උපන්නාවූ වීර සුධීර පවිත්‍ර වූ ප්‍රසන්න වූ කාය සම්පත්ති ඇති මහා ව්‍යක්ත වූ හසළ බුද්ධි හා මනා වීර්‍ය ඇති එකට බැඳුනු මිත්‍රයෝ දෙදෙනෙක් වූවාහු නොවේද? වූවාහුමය.

38. ගුණ ගරුක සියළු සත්වප්‍රජාව අතුරෙන් ගුණ මිණි වැලක් නම් වූ භික්ෂු වංසයෙහි සද්ධර්ම කාමී ජිනවංස තෙරුන් වහන්සෙද ඤාණාරාම තෙරුන් වහන්සෙ ද රුහුණේ සිටි වටිනා වෙරළුමිණි මෙන් නොවේද? වේමැයි.

## 07. ගුණ සුවඳ පිරි විකසිත පුෂ්පයක්

(i) මූලික පියවර

39. ලංකාද්වීප කඩවැද්දූව නම් ගම් පියසෙහි සියල්ලන් ප්‍රබෝධමත් කරමින් උත්තම ප්‍රඥා ඇතිව (සසර පුරුදු කළ) බොහෝ කාලයක් වැජඹෙන්න ගුණ සුවඳ ඇති පද්මයක් මෙන් පහළ වූ පී. ඩී. දිනේස් නම් වූ කුල කුමරුවන් විකසිත වූයේය.

40. එකොපි එකොපි සහස්ස වස්සෙ-
ද්වෙ ද්වෙ සතෙ එගගුන මාස ගිම්හෙ,
පණ්ණාස එකෙ සුහුමුත්ත කාලෙ-
උප්පජ්ජි නෙතා ජින'ච්චයෙන.[7]

41. තස්සා'සි මාගම පුරො පන ජාත භූමිං-
දොන් අප්පුහාමි ජනකො කපුදූව හාමි,
මාතා පිතා තු අලභිංසු සුපුඤ්ඤකාමා-
ද්වෙ පුත්තකෙව සහ ධීතර මෙකිකාය.[8]

42. සො දාරකො යටියන'ට්ඨ සුසත්ථ සාලා-
ආගම්ම සිප්පමලභී චතුවස්ස කාලං,
තස්මා පරං සුගුණතිස්ස මහා යතිස්ස-
භාරං අකංසු ජනනී ච පිතා ච තං හි.

43. ථේරො'සි තස්ස පිතරෙන සුජාතභාතා-
වුද්ධාගතො සුගුණතිස්ස යතීභිධානො,
පුබ්බාධිකාර ගුණවා අභිනික්ඛමෙන-
සාමඤ්ඤ භාව පටිලාභ සමත්ථකො'සි.

44. කත්වා යතී සුගුණතිස්ස උපජ්ඣයෙන-
ථෙරො පනා'රිය විලාස ගරුම්පි කත්වා,
කොදාගොඩබ්‍ය උපසෙන'පි නායකෙන-
පබ්බජි සො දහර චුද්දස වස්සිකො හො.

40. වර්ෂ එක් දහසක්- එක් දහසක් වූ කල්හි වර්ෂ දෙසීයක්- දෙසීයක් වූ කල්හි වර්ෂ පනස් එකක් වූ කල්හි එනම් ජිනේද්‍රයන් වහන්සෙගේ පිරිණිවන් පෑමෙන් බු. ව. 2451 කුත් ගිම්හාන සෘතුවෙහි එග්ගුන නම් වූ අප්‍රේල් මස පළමු වන දින උදාවූ සුභ මොහොතෙහි අපේ කථා නායකයාණෝ ලොව උපන්නෝ විය.

41. කථානායකයන්ගේ උපන් භූමිය වනාහි මාගම් පුරය විය. නුවණැති පුණ්‍ය කාමී දොන් අප්පුහාමි හා කපුදුව හාමි ඔහුගේ දෙමාපියෝ වූහ. ඔවුනට පුත්‍රයෝ දෙදෙනෙක් හා උතුම් එක් දියණියක් ද වූහ.

42. ලාබාල වූ හෙතෙමේ යටියන පාඨශාලාවට ගියේය. එහිදී සතර වන පංතිය දක්වා පමණක් සමර්ථ විය. පසු කලෙක්හි ඥානවන්ත වූ ඔහුගේ අම්මත් තාත්තත් පිංවත් වූ ඔහුව සුගුණතිස්ස මහයතිවරයන් වහන්සෙට භාර කළෝය.

43. එම තෙරුන් වහන්සෙ වනාහි පිංවත් පුතණුවන්ගේ පියා සමඟ එකට උපන් සහෝදර වූ වයෝවෘද්ධ ගුණ ඇති සුගුණතිස්ස යතිවරයන් වහන්සෙ විය. විශේෂ පිණැති ගුණවත් පී. ඩී. දිනේස් පුතණු තෙමෙ වනාහි අභිනිෂ්ක්‍රමණයෙන් පසු පැවිද්ද ලැබීමට සමර්ථයෙක් විය.

44. අතිගරු සුගුණතිස්ස යතිවරයන් වහන්සෙ උපාධ්‍යාය කොට අතිගරු අරියවිලාසාසභ තෙරුන් වහන්සෙ ආචාර්ය කොට අතිගරු කෝදාගොඩ උපසෙන නායක තෙරුන්වහන්සෙගේ සුරතින් ධාරවූ දා හතර වයස් ඇති හෙතෙමෙ පැවිදි වූවාහු වෙත්.

45. යො එක වීසති සහස්සපි කිත්තුවසෙස-
ආසාළ්හකෙ නවසතෙ සුහුමුත්ත කාලෙ,
පජ්ජොත ඉන්දු'මිව සාසන අන්තලික්ඛෙ-
නාමෙන හොපි ජිනවංස සුපබ්බජොසී.

46. වස්සං තීණි හොරණහි හව් පුබ්බරාමෙ-
උග්ගණ්හි ධම්මවිනයං පති නායකෙන,
පබ්ජා පයාගල මහාවිහාරහි එක වස්සං-
සද්ධම්මවංස හව් තත්‍ර ගණස්ස නෙතු.

47. ධම්මොදයම්හි පරිවෙණ'හි නායකොයො-
සද්ධම්මවංස හව් පතර්ට කිත්තිසොසො,
වස්සානි සත්ත වසමාන ගරුම්පි හුත්වා-
ධාරෙසි සො සුපරියත්ති සුධම්මකායං.

(ii)උපසම්පදා භාවො

48. ලඞ්කාය මාගමෙ දෙසෙ - ගාමම්හි කඩවැද්දුසමිං,
සුසීහල කුලෙ ජාතො - ජාතියා වීසතී ආයු.[9]

49. නාමෙ රාමඤ්ඤ ඛෙත්ත සො-
සුද්ධයානෙ වසන්තො යො,
තිපිටකෙසු ඡෙකො ච-
නානා දිසාසු විස්සුතො.

45. යමෙක් වනාහි ක්‍රි. ව. එක් දහස් නවසිය විසි එකක්(1921) වූ ඇසළ මස විසි එක් (21) වන දින උතුම් සුභ මොහොතෙක්හි පැවිදි වූයේ වීද හෙතෙම සසුනඹරෙහි බැබළෙන සඳු මෙන් පිංවත් කඩවැද්දූවේ ජිනවංස නමින් පැවිදි වූයේය.

46. හොරණ පූර්වාරාම විහාරයෙහි හෙතෙමේ වසර තුනක් වැඩ සිටියේ, එහි අධිපති අතිගරු කැකණඳුරේ අරියවිලාසාසභ නායක මාහිමියන් වහන්සෙ වෙතින් මූලික ධර්ම විනය ඉගෙන ගත්තේය. (ක්‍රි. ව. 1921 - 1924) පසුව පයාගල ධර්මගුප්ත මහා විහාර පිරිවෙණෙහි එක් වසක්ද ඉගෙන ගනිමින් සිටියේය.

47. වැල්ලවත්ත ශ්‍රී ධර්මෝදය පිරිවෙණෙහි පැතිරීගිය කීර්ති ඝෝසා ඇති යම් නායකයන් වහන්සෙනමක් වේද හෙතෙමේ නමින් රස්නකවැවේ ශ්‍රී සද්ධම්මවංස මහ තෙරනුවෝම විය. ජිනවංස හිමිපාණෝ සත් වසක් (ක්‍රි. ව. 1925 - 1932) එහි වසන්නේ එහිම ගුරුවරයෙක් ද වී හෙතෙමේ සුධම්මකාය නම් වූ ත්‍රිපිටක පරියත්තිය මනාසෙ දැරුවේය.

(ii) උපසපන් වීම

48. ශ්‍රී ලංකාවේ මාගම් දේශයේ පිහිටි කඩවැද්දූව ගමෙහි සිටි සිංහල පවිලෙක්හි උපන්නාවූ ගරු ජිනවංස තෙරණුවෝ උප්පත්තියෙන් විසි වසර සම්පූර්ණ වූයෙක් විය.

49. රාමඤ්ඤ ක්ෂේත්‍ර නම් වූ සුපිරිසිදු සාසනස්ථානයෙහි වසන්නාවූ යම් කෙනෙක් වේද- උන්වහන්සෙ ත්‍රිපිටකයෙහි දක්ෂයෙක්ව නොයෙක් දිසාවන්හි ප්‍රසිද්ධ වූයේය.

50. තත්ථෙ'ච සාමණෙරානං-
කාරෙතුං උපසම්පදා,
නජ්ජා මිරිස්ස පොලවත්ත-
හව් උදකුක්ඛෙපකං.

51. සත්තවීසති සහස්සෙ'ක-
නවසතෙ සුනක්ඛත්තෙ,
පුරෙ'හ'සාළ්හ* මාසෙ සො-
පාපුණී අධිසීලකං.

52. රාමඤ්ඤස්මිං චතුත්ථො සො-
විසාරදො මහානෙතා,
ධම්මාචරිය ඤාණින්දො-
තස්ස ආසි උපජ්ඣායො.

53. හො අග්ගධම්ම'ලඞ්කාරො-
නායකො ඉන්දසාරො ච,
අත්ථදස්සී මහා සාමී-
කම්මා'චරියකා හෙසුං.

54. හො පඤ්ඤාසිරි ථෙරොච-
අත්ථො කුසල ජෙකොච,
සො ධම්මදින්න ද්විතීය-
එතෙ දුතියකා හෙසුං.

55. ගරු සද්ධම්මවංසොච-
පණ්ඩිත සීල'ලඞ්කාරො,
පණ්ඩිත ධම්මවංසොච-
එතෙ තතියකා හෙසුං.

---

* පුරෙ + අසාළ්හ = පුරෙහසාළ්හ (හකාරාගම විමෙනි.)

50. ඒ නිකායෙහි වසන සාමණේර වරුන්ගේ උපසම්පදා කරන ස්ථානයක් වූ මිරිසස පොල්වතු මෝදර ගෙහෙහි අබද්ධ වූ උදකුක්ඛේප සීමාවක් විය.

51. සත් විස්සක්- එක් දහසක්- නවසියයක් වූ එනම් ක්‍රි. ව. 1927 ඇසළ මස පුර පක්ෂයේ තුන්වන තිථිය ලත් දින උදාවූ සුභ මොහොතෙහි (ප. ව. 3:05 ට) අධිසීල සංඛ්‍යාත උපසම්පදා භූමියට පත් කරන ලද්දේ විය.

52. රාමඤ්ඤ නිකායේ සතර වන මහා නායක වූ ත්‍රිපිටක විශාරද සද්ධම්මා චරිය මාතර දික්වැල්ලේ ශ්‍රී ඤාණින්දාසභ මාහිමියෝ ජිනවංස තෙරණුවන්ගේ උපසම්පදා උපාධ්‍යාය වූහ.

53. පිංවත් අතිගරු මාතලේ අග්ගධම්මාලංකාර සඤ්ඤා ලේඛක මාහිමි- අතිගරු කරතොට ශ්‍රී ඉන්දසාර මහාථේර- අතිගරු කොටවායේ අත්ථදස්සී මහා ථේර යන මහතෙරුන් වහන්සෙලා ගරු ජිනවංස භික්ෂුවගේ ප්‍රථම කර්මාචාර්යයෝ වූහ.

54. පිංවත් අතිගරු මාතලේ පඤ්ඤාසිරි මහාථෙර- ත්‍රිපිටකයෙහි දක්ෂ වූ පුවක්දෙණියේ අත්ථකුසල මහාථේර අතිගරු හකුරුගම්මන ධම්මදින්න මහාථේර යන මහතෙරුන් වහන්සෙලා ද්විතීය කර්මාචාර්යයෝ වූහ.

55. අතිගරු රස්නකවැවේ සද්ධම්මවංස මහාථේර- අතිගරු පණ්ඩිත මුල්ලේගම ශ්‍රී සීලාලංකාර මහාථේර- අතිගරු පණ්ඩිත මාතර ධම්මවංස මහාථේර යන සාසන භාරධාරී මහතෙරුන් වහන්සෙලා තුන්වන කර්මාචාර්යයෝ වූහ.

(iii) ගංගාරාමො හවි පරිවෙණං

56. ගංගාරාමාධිකාරී සො-
සීලඤ්විමල නායකො,
රූප ජීරණප්පත්තො සි-
තත්ථෙ’කතිංස වස්සෙහි.

57. ථෙරා’රිය විලාසස්ස-
හො කිඞ්කරො ධීර සිස්සො,
නායකො ජිනවංසොසි-
සද්ධම්ම දෙසකො ඡෙකො.

58. තස්ස ථෙරස්ස සිස්සො’පි-
පටිපත්ති විසාරදො,
ජිනවංස මහා ථෙරො-
ගංගාරාමෙ අධිප්පච්චො.

59. පත්ථටො කිත්ති ඝොසො ච-
විහාරස්මිං වසන්තො සො,
කාතුං ච තං පරිවෙණං-
ඉච්ඡමානො’සි තත්ථ ච.

60. අඨතිංස එක සහස්ස-
නවසතෙ සංවච්ඡරෙ,
තං සුගතත්ථාකරං නාමං-
පරිවෙණං සුකාරයි.

(iii) ගංභාරාමය ග්‍රන්ථාකර පිරිවෙණක් වීම

56. ගංගාරාමාධිකාරීව විසූ ප්‍රපූජ්‍ය සීලවිමල නායක තෙරුන් වහන්සෙ එම සතවර්ෂයේම තිස් එක් වන වර්ෂයේ එනම් ක්‍රි. ව. 1931 දී උන් වහන්සෙ රූප ජීරණයට හෙවත් අපවත් වූ සේක.

57. ප්‍රපූජ්‍ය කැකණ්දුරේ අරියවිලාසාසභ තෙරුන් වහන්සෙගේ සුවිනීත ඥාණවන්ත ශිෂ්‍ය වූ දක්ෂ සද්ධර්ම දේශක වූ සුපින්වත් ජිනවංස නම් ථෙර කෙනෙක් වූහ.

58. එකී මහතෙරුන් වහන්සෙගේ ශිෂ්‍ය ප්‍රතිපත්ති විශාරද ජිනවංස මහා තෙරනුවෝ (සීලවිමල තෙරුන්ගේ අපවත් වීමෙන් පසු) ගංගාරාම විහාරයෙහි අධිපති තෙරුන්වහන්සෙ බවට පත් වූහ.

59. පැතිරීගිය කීර්ති ඝෝෂා ඇති ගංගාරාමයෙහි සද්ධර්ම නායක වූ හෙතෙමේ තත් විහාරය පිරිවෙණක් කිරීමට සිතමින් (හඟිමින්) එහිම වසන්නේ විය.

60. තිස් දෙකක්ද එක් දහසක්ද නවසියයක්ද වූ එනම් ක්‍රි. ව. 1932 වර්ෂයේදී තත් විහාරය ග්‍රන්ථාකාර නමින් යුත් පිරිවෙණක් කරවීය.

(iv) ව්‍යත්ත බලෙන ච ලෙඛන කුසලෙන ච කත ධම්ම යුද්ධං

61. තත්‍ර වසන්තස්ස යතිස්සරස්ස-
ධම්මං මනුඤ්ඤං මධුකං විලාසං,
සුදෙසනං ව්‍යප්පථ පෙමණීයං- උපෙ
සො හොසි ලොකස්ස'සහාය නෙතා.[10]

62. මහායතී ලොක'නුජීවිකෙහි- උපෙ
ද්වෙ ආයුධානි කත්තික්ඛ භාවං,
වාචා බලං ලෙඛන දක්ඛභාවං-
එතානි හෙසුං යති නායකස්ස.

63. සො ජාතියා තානි සුලද්ධ ථෙරො-
පවත්ති පණ්ණං පන යුද්ධ කත්වා, උපෙ
සො පොසිතා චිත්ත වසී'ව මන්තා-
ලෙඛා ච පෙසී හදයඞ්ගමාය.

64. එතෙ පයුත්තා වර සාධු පඤ්ඤා-
හෙසුං සුසන්තුට්ඨා'පි මානසා තෙ,
අසාධු හෙසුං පරි දුම්මනා තෙ- උපෙ
තෙහී ච නින්දා වචනං වදිංසු.

65. සෙට්ඨ කුලෙ ජාත සුධීර ථෙරො-
සො මනඩමානො'ව පරප්පවාදං,
සංසුද්ධ ආණම්පි ගවෙසමානො-
ලෙඛා යතී පෙසි පවත්ති පණ්ණං.

(iv) වාග් බලයෙන් හා ලේඛන කුසලයෙන් කළ සටන

61. තත් විහාරයෙහිම වසන්නාවූ යතිවරයන් වහන්සෙට මධුර මනෝඥ ප්‍රේමනීය වචන ගර්භිත මනා ධර්ම දේශන විලාසයක් ඇති උන්වහන්සෙව ලෝකයාගේ අසහාය නේතෘන් වහන්සෙ බවට පත් විය.

62. මහා යතිවර ලෝකයට අනුව ජීවත් වන නායකයන් විසින් ශ්‍රේෂ්ඨ වූ ආයුධ යුග්මයක් තියුණු බවට පත් කර ගත යුතුය. එනම් වාග් බලය හා ලේඛන කුසලතාව යන මේවා යුග පුරුෂයෙකුගේ ශ්‍රේෂ්ඨ ධර්මයෝ වූහ.

63. ඒ ශ්‍රේෂ්ඨ ධර්මයන් උප්පත්තියෙන්ම ලැබුණු ඒ කඩවැද්දුවේ ජිනවංස තෙරුන් වහන්සෙ පුවත් පත රණබිම කොට හදවතෙහි පෝෂිත වූ චිත්ත වසී මන්ත්‍ර බඳු ලිපි හෙතෙමේ පුවත්පතට යැව්වේය.

64. ඒ ලිපි කියවන්නාවූ උතුම් ප්‍රඥා ඇති සත්පුරුෂයෝ සතුටු සිත් ඇත්තෝ වෙත්. අසත්පුරුෂයෝ හාත් පසින්ම නරක සිත් ඇත්තො වූහ. තවද ඔවුන් විසින් අප කථානායකයන් වහන්සෙට තද නින්දා අපහාස වචන කීහ.

65. ශ්‍රේෂ්ඨ කුලයෙක්හි උපන්නාවූ ඒ වීර තෙරුන් වහන්සෙ පරවාද (අනුන් ඉදිරිපත් කරන වාද විවාද) මඩිමින් දුරුකරන්නේම සුපිරිසිදු සාසන ආඥාය ගවේසනය කරන්නා වූ ඒ යතිවරයන් වහන්සෙ නැවතද පුවත්පතට ලිපි යැවූහ.

(v) දුතියාභිනික්ඛමනං

66. එතානි නිස්සාය ජනා උළාරා-
සුසං කරෙතුං අගමිංසු ථෙරං, උපෙ
ථෙරස්ස අජ්ඣාසවරම්පි ඤත්වා-
චින්තිංසු කාතුං නව සාසනං තෙ.

67. මාතා පිතූහි සහ සොදර ඤාතකෙච-
සබ්බං පහාය මභිනික්ඛමි ගෙහතොච,
සංසාර භීරුක චතුද්දස වස්සිකො සො-
අනෙඤ්ඤාගධොමහචි නිම්මල සාසනස්ස.[11]

68. ගතෙ'ක තාලීසති ජාතියා සො- උපෙ
ගන්ථාකරං පාරිවණ්ණම්පි සබ්බං,
පහාය පුබ්බෙ'වනුයාතගන්තා- උපෙ
දවත්තික්ඛ වාරං අභි  නික්ඛමීසො.[12]

69. පත්තංච තෙචීවර තාලපණ්ණං- උපෙ
ආදාය එකො බහි නික්ඛමන්තො,
සිස්සෙච සෙසෙච පහාය සබ්බං-
මග්ගං පථං පාවිසි ධම්මකෙතු.

70. සඞ්කාර'මාචිණ්ණ පථං යථාපි-
තථාපි ඤාණං පරිසොධනත්ථං, උපෙ
එකො'ච කාතුම්පි සුධම්ම යුද්ධං-
සො අඤ්ජසං පාවිසි ඉන්දඛීලො.

## (v) දෙවන අභිනිෂ්ක්‍රමණය

66. මේ පුවත්පත් ගත ලේඛන නිසා පැහැදුනු උළාර සිත් ඇති ජනයෝ තෙරුන් වහන්සෙ වෙත සාකච්ඡා කිරීම සඳහා පැමිණියහ. මෙසෙ සාකච්ඡාකර තෙරුන් වහන්සෙගේ උදාර සාසනික පැවැත්ම ගැන දරන අදහස ඉතා හොඳින් දැනගත් ඔවුහුද නව සාසන පුනරුදය කිරීම සඳහා උදව් කරන්න සිතූහ.

67. මව්පියන් සමග සහෝදර සහෝදරියන් ඥාතීන් සහිත සියල්ල අතහැර හෙතෙමේ ගිහිගෙයින් නික්මුනේය. සංසාරයේ භයදක්නාවූ හෙතෙමේ තුදුස් වියේදී නිර්මල බුදු සසුනට ඇතුල්වුනේ විය. (පළමු අභිනිෂ්ක්‍රමණය)

68. උප්පත්තියෙන් වයස 41 ක් පමණ වූ උන් වහන්සෙ ග්‍රන්ථාකාර පිරිවෙණත් සහිත සියල්ල අතහැර පූර්ව ආර්‍ය උතුමන් වහන්සෙලාට අනුයාත වූ හෙතෙමේ දෙවන වරටත් අභිනිෂ්ක්‍රමනය මෙසෙ කලේය.

69. අධිෂ්ඨිත තුන් සිව්රත්- පාත්‍රයත් හා ගොටු අත්තත් ගෙන හුදකලාවම පිටත නික්මෙන්නා වූ උන් වහන්සෙ ශිෂ්‍යයන් ද සෙස්සන් ද සියල්ල අතහැර ඒ ධර්මද්ධජයන් වහන්සෙ මාර්ග පථයට පිවිසියේය.

70. ගැවසීගත් කුණු ඇති මාර්ගයක් යම්සෙ ද? එසෙම දුශ්ශීලාදී අප්‍රතිපත්තිකාමීන්ගෙන් ගැවසිගත් සාසනය හාත්පසින් පිරිසිදු කිරීම සඳහා හුදකලාවම ධර්ම යුද්ධයක් කිරීමට ඉන්ද්‍රඛීලයක් බඳු හෙතෙමේ ධර්ම මාර්ගයට පිවිසියේ ය.

71. සන්නද්ධ රාජොව රණම්පි ගන්ත්වා-
සද්ධම්ම යුද්ධං පවරං කරොන්තො,
ගවෙසමානො අනුගාමිකෙ සො- උපෙ
විස්සාසකං ගන්තු ම’භි’වඤ්ඡී’ති.

72. ධම්මාධිපච්චො විජයාභිරාමෙ-
සහායකො නෙකගුණෙහියුත්තො, උපෙ
භාසාසු ඡෙකො පරියත්තිසාරො-
ඤාණාදිරාමො භවි සඞ්ඝ නෙතා.

73. යත්‍රා’පි ථෙරො ජිනවංස ගච්ඡි-
ඤාණාදිරාමෙන සුසංකථෙත්වා,
තෙ එකයිත්වා’රුහනං’පි ආණං-
තං පත්ථරිංසු පවිසිත්ව මග්ගං.[13]

## 08. සිරි කල්‍යාණි යොගස්සම සන්ථා’යං

74. මාරංව යුද්ධං ච සමානමානං-
සබ්බං පහිත්වා පරවාද නීචං,
කල්‍යාණි යොගස්සම නාම සන්ථං-
සාධූහි සද්ධිං පන සො පතිට්ඨී.

75. වස්සෙ පණ්ණාසේක නවසත සහස්සකෙ-
ජුණ්හ ජෙට්ඨස්ස’ට්ඨ දස දිවස නක්ඛත්තෙ,
යොගී බීජෙ ද්වාදස තනුජකෙ එතෙ-
පබ්බාජෙත්වා සාසන නභතලමනෙත්ථාසිං.[14]

71. ආයුධ සන්නද්ධ රජෙක් මෙන් රණ බිමට ගොස් උතුම් වූ ධර්ම යුද්ධය කරන්නාවූ හෙතෙමේ අනුගාමිකයන් ගවේශනය කරන්නේ එක් විශ්වාසවන්තයෙකු වෙත යන්නට සිතුවේය.

72. විජයාරාමයේ ධර්මාධිපති වූ අනේක ගුණ භූෂණයෙන් යුක්ත වූ සහායක වූ භාෂාවන්හි දක්ෂ වූ පරියත්ති විශාරද වූ ඤාණාරාම නම් සඞ්ඝ නායකයන් වහන්සෙ නමක් විය.

73. අතිගරු ඤාණාරාම තෙරුන් වහන්සෙ යම් තැනෙක්හිද එතනට ජිනවංස තෙරණුවෝ ගියේය. ගොස් අතිගරු ඤාණාරාම තෙරුන් වහන්සෙ සමඟ සාකච්ඡා කොට ඔවුහු එකට එක් වී ආඥා චක්‍රය නම් වූ බුදු සසුන ගොඩ නැගීමට මාර්ගයට පිවිස- ඒ සසුන් ගමන පැතුරූහ.

## 08. ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම භික්ෂු සංස්ථාව

74. මාර යුද්ධයකට සමාන වූ නීච පරවාද සියල්ල දුරු කොට සිරි ලකෙහි ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවක් සත්පුරුෂයන් සමඟ හෙතෙමේ පිහිටුවේය.

75. එක් සහස්‍රයක්- නවසියයක්- පනස් එකක් වූ එනම් ක්‍රි. ව. 1951 වර්ෂයේ ජෙට්ඨ නම් වූ පොසොන් මස 18 වන උදාවූ සඳරැස් පිරි පුන් පසළොස්වක් සුභ නැකැත් දවසෙහි දොළොසක් වූ යෝගාංකුර පුත්‍රයන් සත්පුරුෂයන් වහන්සෙලා ඔවුන් පැවිදි කර සසුන'ඹර තලයට ඇතුලත් කළහ.

76. දෙල්දූවෙ සෙනාසනං ඨීත සිරි ආරාමං-
එතෙසං පබ්බජ්ජ භූමි පවර ලද්ධා'සි,
තෙසං පුත්තානං අහොසි සමනුපජ්ඣායො-
ධම්මොදෙ සද්ධම්ම වංස ගරු මහා සාමී.

77. හො ඤාණාරාමො අධිපති ජිනවංසො ච-
තෙසං නිස්සායෙ'ව නිධි සදිස ඨානීයං,
කල්‍යාණියොගස්සම සුගණ නිකායක්ඛ්‍යං-
මාපෙසුං ථෙරා සූරිය පදුමමෙකෙතවා.

78. මාදම්පා නජ්ජා කතෙපි උදකුක්ඛෙපෙ-
ථෙරො හො ඤාණිස්සරො අහවි උපජ්ඣායො,
ථෙරෙහි සද්ධිං කතං දුතිය ඡණං නාමං-
කාරෙසුං යොගස්සම පඨම අධිසීලං තං.

79. ථෙරො සුභාරති සිරිඅවිමලො ච සීලා-
ලංකාර ධම්මතිලකො පියදස්සි නාමො,
තෙ අහෙසුං අරියවංස ච උත්තරානන්-
දො නායකො යතිවරො ඡණ උස්සවස්මිං.

80. ඤාණාදිරාම ජිනවංස මහා යතීහි-
යොගස්සමෙ සුවපිතං වර සංස බීජං,
රොපිතව තුංග ඵල ගන්ධ සකිත්ති නාදං-
ලද්ධාය සීහළ පජං භවි ධම්ම දාසං.[15]

76. දෙල්දූව ක්ෂේත්‍රයෙහි පිහිටි උතුම් වූ විවේකා රාමය ඔවුන්ගේ ධර්ම නිජ පොළෝ තලය වූහ. ශ්‍රී සද්ධර්මෝදය පරිවේණාදිපති රස්නකවැවේ ශ්‍රී සද්ධම්මවංස අනුනායක මාහිමි ඒ කුල දරුවන්ගේ උපාධ්‍යායන් වහන්සෙ විය.

77. පිංවත් අතිගරු ඤාණාරාම මහතෙරුන් වහන්සෙ ද අධිපති අතිගරු ජිනවංස මහ තෙරුන් වහන්සෙද ඒ කුල දරුවන්ගේ පැවිද්ද නිසාම නිධන් පුරයක් බඳු ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම භික්ෂු නිකායක් නම් වූ සූර්යීය පද්මයක් තෙරුන් වහන්සෙලා එකතු වී බිහි කළහ.

78. මාදම්පා නදියෙහි මනාව කරන ලද උදකුක්ඛෙප සීමාවෙහි පිංවත් කිතලව ඤාණිස්සර තෙරුන් වහන්සෙ උපාධ්‍යාය කර තෙරුන් වහන්සෙලා සමඟ යෝගාශ්‍රමීය දෙවන උතුම් උත්සවය නම් වූ ප්‍රථම අධිසීලෝපසම්පදාව කළහ.

79. අතිගරු කට්ටමුරිච්චානේ සිරි සුභාරති- පණ්ඩිත මුල්ලේගම සිරි සීලාලංකාර- නාරණපිටියේ සිරිවිමල- පූස්සැල්ලේ ධම්මතිලක- ඉඳුරුවේ උත්තරානන්ද- අලුබෝමුල්ලේ සිරි අරියවංස යන තෙරුන් වහන්සෙලා සුභ නැකැත් උත්සවයෙහි වූහ.

80. අතිගරු මාතර ශ්‍රී ඤාණාරාම අතිගරු සිරි ජිනවංස යන මහා යතිවරයන් වහන්සෙලා විසින් යෝගාශ්‍රමයෙහි වපුරන ලද උතුම් සඬස බීජය රෝපනය වී ලංකාවාසී සිහළ ජනයාටඋතුම් ඵල සුවඳ සහිත කීර්ති නාදය වැනි ධර්මාදාසයක් විය.

81. ගච්ඡන්ත තේ'පි මුනි දෙසිත ධම්ම මග්ග-
දිස්වා ච ථේර පභවෝ අනුයාතගන්තා,
ආකිණ්ණ ගන්ධ කුසුමාදි'ව එකයිත්වා-
යෝගස්සමං විමල සාසන ජෝතයිංසු.

82. සඞ්ඝස්ස ධම්මතිලකෝ'සි උපජ්ඣභූතෝ-
ථේරාසභෝ විමලවංස මහා යතින්දෝ,
ථේරෝ ච පණ්ඩිත යතී විමලාභිවංසෝ-
භෝ සීල රක්ඛිත තපෝ ගුණ භූසිතෝ සෝ.

83. භෝ නායකෝ රතනපාල'භිධාන ථේරෝ-
මිත්තෝ'පි තස්ස සුමනෝ භවි ධම්ම කාමෝ,
එකෝ'පි මූනගමජෝ සුමනෝ'ච ථේරෝ-
තේසම්පි තෙ ථවිරා පරිවාරකා'සුං.

### 09. (i) සෝ ලද්ධං පඨම යෝගස්සමං

84. යං ගෝපිතං භවති තිස්ස යටාල රඤ්ඤා-
මාගම්පුරේ ඨිත වනේ'සි තපෝ ච භූමිං,
භෝ ධම්මදින්න අරහත්ත නිවාසිතං තං-
නාමං තලංගර ගිරිං භවි සුන්දරං තං.

81. මුනි දේශිත ධර්ම මාර්ගයෙහි වඩින්නාවූ උන්වහන්සෙලා දැක ඒ අනුව වඩින්නා වූ මහා ථෙර ප්‍රභූ වරයෝ මල් ආදියෙන් සුවඳ ගැවසී ගත්තාත් මෙන් එකතු යෝගාශ්‍රම නැමැති නිර්මල සාසන වැඩ පිළිවෙල ආලෝක මත් කළහ.

82. අතිගරු පුස්සැල්ලේ ධම්මතිලක නායකයාණෝ සඞසයාට උපාධ්‍යාය විය. ථේරාසභ බැඹියේ විමලවංස නම් මහා යතින්ද්‍රයන් වහන්සේ ද, පණ්ඩිතාචාර්‍ය ගැටමාන්නේ විමලවංස තෙරුන් වහන්සේ ද, තපෝ ගුණයෙන් හෙබි මාතලේ සීල රක්ඛිත නම් වූ තෙරුන් වහන්සෙද-

83. අතිගරු අස්මඩලේ රතනපාල තෙරුන් වහන්සෙද උන්වහන්සෙගේ මිත්‍ර වූ ධර්ම කාමී කෙහෙල්පන්නල සුමන යතිවරයන් වහන්සෙද- තවත් මූතගම ගමෙහි උපන් සිරි සුමන නම් තෙරවරයෙක්ද යනාදි මේ මහා තෙරුන් වහන්සෙලා (ප්‍රපූජ්‍ය මාතර මාහිමි- ප්‍රපූජ්‍ය කඩවැද්දූවේ මාහිමි යන මේ දෙනම වහන්සෙලාගේ) පාරිචාරක (අනුවයන) තෙරුන් වහන්සේලා වූහ.

## 09. (i) කථානායකයාණෝ ලත් ප්‍රථම යෝගමසපුව

84. භූපති යටාල තිස්ස රජු විසින් ගෝපනය කරන ලද යම් තපෝ භූමියක් වේද එය මාගම් පුරයෙහි පිහිටි වනයෙහි වූයේය. පිංවත් ධම්මදින්න රහතන් වහනසේ වැඩ සිටි එය සුන්දරය. නමින් තලගුරු පව් වෙහෙර නම් විය.

85. ධම්මප්පචාරක සභං භවි යොධ කණ්ඩ-
පණ්ණාස එක'පි සහස්ස නවෙ සතෙච,
අට්ඨාරසෙ හි උපගණ්හිතු තං පඨමඤ්ච වස්සං-
තෙහී කතං නිමල නාම තපො සුවණ්ණං.

86. සඞ්ගාම භූමි භවි රොග නිවාරනත්ථං-
ලොකස්ස ඣාපන කිලෙස විසොධනත්ථං,
පොරාණ භාව ගත ධම්ම සුනිම්මිතං තං-
සොධෙත්ව තස්ස නිමලං ධරණිං දදිංසු.

(ii)සො ලද්ධා'වසෙස යොග භූමි

87. ලඞ්කාය පච්ඡිම සවුත්තර මජ්ඣ දෙසං-
පණ්ණාස එක'පි සහස්ස නවෙ සතෙ ච,
ආරාධයී ගහපතෙ ජිනවංස තස්ස-
ගාමම්හි ගනේතිරිය ධම්මම'දෙසනත්ථං.

88. සද්ධම්ම ම'දෙසන විසාරද කාරණෙන-
සම්මොදිතා ජනපජා නව'මොතරිත්වා,
නානා දිසාසු නව අස්සම ඨානි කත්වා-
පූජිංසු තෙ නර පජා ජිනවංස තස්ස.

89. එකං අරඤ්ඤං භවි ගනේතිරියාව නාමං-
හොසී'පි නාථගණ සඞ්ඝ සමූල ඨානං,
නාමම්පි නා-උයන නාග වනං සුවණ්ණං-
නාගොල්ලමාදි විදිසාසු කරිංසු'රාමෙ.

85. යෝධ කණ්ඩියේ පිහිටි සද්ධර්ම ප්‍රචාරක සමිතිය මගින් 1951 ඇසළ මස 18 වන දින පළමු වන වස එළඹීම සඳහා ඒ සමිති සාමාජිකයන් විසින් නිමලව නම් වූ සුවර්ණ තපෝ භූමිය කරන ලදී.

86. සංසාර රෝග නිවාරණය පිණිස එය සංග්‍රාම භූමියක් විය. ලෝක ජනයාගේ දැවෙන කෙලෙස් සෝධනය පිණිසත් විය. පුරාණ බවට ගිය නමුදු ධර්මයෙන් ම මවන ලද මෙය පිරිසිදු කොට නිර්මල පොළොව අතිගරු ජිනවස් පඩි මාහිමිට ඔවුහු පූජා කළහ.

(ii) තත් නායකයාණෝ ලත් සෙස නිජ භූමි

87. ලංකාවෙහි බටහිරටත් උතුරටත් අතර පිහිටි මධ්‍ය දේශයක් විය. එනම් වයඹ පලාත නම්. පනස් එකක්- නවසියයක්- දසසියයක් වූ එනම් 1951 ජනවාරි මාසයේ ගන්තිරියාව නම් ගමෙහි ධර්ම දේශනාවක් සඳහා ඒ ජිනවංස තෙරුන් වහන්සෙට එක් පින්වතෙක් ආරාධනය කළේය.

88. ඒ විශාරද වූ සද්ධර්ම දේශනාව හෙතුවෙන් සම්මෝදිත වූ සත්වප්‍රජාව නව මහකට බැස එම පලාතේ නොයෙක් දිශාවන්හි නව ආශ්‍රම පඨ කොට ඒ නර ප්‍රජාව ජිනවංස මහ තෙරුන් වහන්සෙට පිදූහ.

89. එම පළාතේ ගන්තිරියාව නම් එක් අරඤ්ඤයක් විය. තවද නාඨගන නම් වූ ආරණ්‍ය සඞ්ඝ මූලාස්ථානයක් විය. තවද සුවර්ණ වූ නා-උයන නම් නා වනයක් විය. තවද අනුදිශාවන්හි නාගොල්ලාදි ආරාමයක් ඔවුහු කළහ.

90. ලඞ්කාදීපෙ විපුල ගුණසාරො යතී කෙසරිනෙදා-
නානාදෙසෙසු සපරිවාරො චාරිකං සඤ්චරන්තො,
ගාමම්හි ගල්දූව සුගුණවඩ්ඪාභි රාමස්ස ගන්ත්වා-
ආරඤ්ඤං කත්ව’පි සපරිවාරො වසී තත්‍ර නෙතු.[16] ෴

91. ථෙරො භො සාසනදසබලං අඤ්ජසං සොධයන්තො-
පණ්ණාසෙ නවසත සහස්සෙ’ක වෙසාඛ පක්ඛෙ,
කල්‍යාණී අස්සම’හි ගමනත්ථාය යං ඛෙම භූමිං-
බුද්ධානුසාසන තිවිධ ආධාරට්ඨානං ලභෙසි. ෴

92. යොගාරාමා ච මඛිල තපො- භූමියො චාදි මෙවං-
පණ්ණාස එක සත පමාණං ගණෙනාරභීතං,
කල්‍යාණී අස්සම’මිව නභෙ චන්ද ආදිච්ච රංසී-
තං සාධූ පඤ්චදස සත වස්සං විචිත්තං ලසෙතු. ෴

## 10. සමාරම්භිත යොගාස්සම පඨම පාලක සඞ්ඝසභා

93. සාමග්ගිතුම්පි පන ථෙර’හි මාපිතස්ස-
ආකුල ඨාන විධමෙත්ව චිරං ජයෙතුං,
සට්ඨී’ට්ඨ එක’පි සහස්ස නවෙ සතෙ ච-
ආසළ්හ සත්ත දිවසෙ සභ’මාරභීතෙ.[17] ෴

90. ශ්‍රී ලංකාද්වීපයෙහි පුලුල් වූ ගුණසාරයක් ඇති චාරිකාවෙහි හැසිරෙන්නාවූ යම් යතිවරයන් වහන්සෙ නමක් වීද හෙතෙමේ ගල්දූව ගමෙහි පිහිටි ගුණවර්ධනාරාමයට පැමිණ එය ආරණ්‍යක් කොට පිරිවර සහිතවම ඒ නායකයන් වහන්සෙ එහිම විසූවේය.

91. ශ්‍රී දසබල සාසන මාර්ගය ශෝධනය කරන්නාවූ තෙරුන් වහන්සෙ ක්‍රි. ව. 1956 වෙසක් මස 5 වන දින ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ඉදිරිගමන සඳහාත් ත්‍රිවිධ බුද්ධානු සාසන පැවැත්මට ආධාර ස්ථාන වූ යම් ක්ෂේම භූමියක් වේද ඒ සඳහා සුදුසු තැනක් ලැබීය.

92. මෙසෙ සියළු යෝගාරාම- තපෝ භූමි ආදීහු භික්ෂු සඞ්ඝයා විසින් ආරම්භ කරන ලද ප්‍රමාණය එකසිය පනහක් (150) පමණ වේ. අහසෙහි දිදුලන සොම් රැස් හිරු රැස් මෙන් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව යහපත්ව පන්දහසක් කල් විචිත්‍රව බැබලේවා!

## 10. කථානායකයන්ගේ නේතෘත්වයෙන් ගොඩනැගූ ප්‍රථම පාලක සඞ්ඝ සභාව

93. තෙරුන් වහන්සෙලා විසින් මවන ලද නිකායික සඞ්ඝයාගේ සාමග්‍රිය පිණිසත් අවුල් වියවුල් තැන් දුරුකොට බොහෝ කාලයක් වැජඹීම පිණිසත් වනාහි ක්‍රි. ව. 1968 වර්ෂයේ ඇසළ මස 7 වන දින සඞ්ඝ සභාවක් උන්වහන්සෙලා ආරම්භ කළ සේක.

94. ථෙරො ච ධම්ම තිලකො විමලාභි වංසො-
ඤාණාදිරාම ජිනවංස'නුසාසකායො,
හෙසුම්පි භො විමලවංස සභාපතී ච-
භො නාගිතො උපසභාපති යොගරාමෙ.

95. භො ලෙඛකො හවි විදූ'ත්තරවංස ථෙරො-
දෙවාදි නන්ද අනුලෙඛක ධම්ම කාමො,
සඤ්ඤා'සි ලෙඛක වරො පරියත්ති සාරො-
ථෙරාසභොඅරියධම්ම සුපුඤ්ඤ කාමො.

96. එකච්ච නායක ඉතො ගත කාරණෙහි-
හෙසුම්පි සඞ්ඝ සභිකා නවකා නිකායෙ,
ජිනාභි වංස යති සො සමුපාද කො'ච-
පණ්ණාස වස්සම'ධික තත්ථ'නුසාසකොසි.

97. භො නාගිතො හවි පධාන සභාපතී ච-
ථෙරො උපජ්ඣ හවි නෙතු ගුණාභිනන්දා,
තත්ථෙව සො උපසභාපති යොගරාමෙ-
කාලං කතස්ස දිනතො'පි ජනාදිනන්දා.

94. යෝගාශ්‍රම පාලක සඞ්ඝ සභාවේ අනුශාසකයෝ නම්
අතිගරු පුස්සැල්ලේ ධම්මතිලක මාහිමි- අතිගරු බැඹියේ
විමලවංස මාහිමි- අතිගරු මාතර ඤාණාරාම මාහිමි- අතිගරු
කඩවැද්දූවේ ජිනවංස මාහිමි යන තෙරවරු වූහ. තවද තත්
යෝගාශ්‍රම සංස්ථාවෙහි සභාපති වශයෙන් අතිගරු
ගැටමාන්නේ විමලවංස මාහිමි- උප සභාපති වශයෙන්
අතිගරු මීතුවන්ගමුවේ නාගිත මාහිමි යන තෙරවරු වූහ.

95. නැණවත් පිංවත් මහකුඹුක්වැව උත්තරවංස තෙරණුවෝ
ප්‍රධාන ලේඛකාධිකාරි වූහ. ධර්මකාමී කෝට්ටේ ශ්‍රී
දේවානන්ද තෙරණුවෝ අනුලේඛකාධකාරී වූහ. ත්‍රිපිටක
පරියත්ති විශාරද පිනැති නා-උයනේ අරියධම්ම තෙරපාදයන්
වහන්සෙ සඤ්ඤාලේඛකාධිකාරී වූ සේක.

96. ඇතැම් නායක තෙරුන් වහන්සෙලා මෙයින් පරලොව ගිය
කාරණය නිසා තත් නිකායේ අළුත් සඞ්ඝ සභිකයෝ වූහ.
යෝගාශ්‍රම සමුත්පාදක ඒ ජිනවංස මහයතිවරයන්
වහන්සෙම වසර පණසකට අධික කලක් එහිම
අනුශාසකයන් වහන්සෙ වූ සේක.

97. යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන සභාපති වශයෙන් සුපින්වත්
මීතුවන්ගමුවේ නාගිත මහතෙරුන් වහන්සෙ විය. තත්
සංස්ථාවේ උපාධ්‍යාය හා උප සභාපති වශයෙන් මාවතගම
ගුණානන්ද නායක මහතෙරණුවෝ විය. උන්වහන්සෙගේ
අපවත් වූ දවසෙ පටන් උප සභාපති වශයෙන් පූජනීය
ජනානන්ද මහතෙරණුවෝ විය.

98. නානා දිසාසු ගත විස්සුත කිත්ති සොසො-
බුද්ධංකුරො අරියධම්ම ගණස්ස නෙතු,
යොගස්සමාධිපති හො අනුසාසකො සො-
සඤ්ඤා ච ලෙඛක පධාන'සි යොගරාමෙ.

99. කිච්චාධිකාරි භවි ථෙර'පි සොමවංසො-
ඒතා'දි සඞ්ඝසභිකා පටිපත්ති කාමා,
තෙවීසතී යතිවරා සහ යොගරාමෙ-
තෙ ජොතයන්තු සුචිරං අවසෙසහී'ති.

## 11. ගුණගන්ධ පුප්ඵස්ස කතොපහාරං

100. ඒකතිංස නවසතෙ - සහස්සෙ පන නායකො,
පාරමහතො සමත්ථෙත්වා - සමතාළීස වස්සෙ හි.[18]

101. වෙමජ්ඣතො ච තාළීස-
පඤ්චාවසාන විභාගමහා,
සො රාජකීය නාමෙන-
පණ්ඩිතො'පාධි ලද්ධො'සි.

102. සත්තවීසති කත්තිකෙ - ලභෙසි ගාරවං නාමං,
ඒකූන සත වස්සෙහි - සතෙ නව සහස්සම්හි.

103. යතින්ද ජින වංසෙන - මුදාර පටි පත්තිස්ස,
කතස්ස ගාරවත්ථාය - අමපුර සංසෙන.

104. සොභනො පටිපත්තීව - ගණපාමොක්ඛ ආචාරී,
ඒතං ගාරව නාමම්පි - ඒතෙ ථෙරස්ස පූජිංසු.

98. නොයෙක් දිශාවන්හි පැතිරී ගිය කීර්ති ඝෝෂා ඇති සමූහයාට නායක වූ අතිගරු නා-උයනේ අරියධම්ම නම් බුද්ධාංකුරයන් වහන්සෙනමක් වේද ඒ තෙරුන් වහන්සෙ වත්මන් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමාධිපති හා ප්‍රධාන අනුශාසකයන් වහන්සෙ වූ සේක. තවද යෝගාශ්‍රම පාලක සඞ්ඝ සභාවේ සඤ්ඤා ලේඛක හා ප්‍රධාන ලේඛකාධිකාරීන් වහන්සෙද වූ සේක.

99. යෝගාශ්‍රමයෙහි කෘත්‍යාධිකාරී කහගොල්ලේ සෝමවංස තෙරුන් වහන්සෙ ආදී ඒ ප්‍රතිපත්ති කාමී සඞ්ඝ සභික වූ තෙවිසි යතිවරයන් වහන්සේලා ද අවශේස වූ ථේර නවක මජ්ඣිම භික්ෂූන් වහන්සෙලා සමඟ බොහෝ කලක් තත් සංස්ථාව බබළවතවා!

## 11. ගුණ සුවඳැති පුෂ්පයට කෘතෝපකාර

100, 101. තෙරුන් වහන්සෙ වනාහි ක්‍රි. ව.1931 වර්ෂයේ ප්‍රචීන ප්‍රාරම්භ විභාගයෙන්ද ක්‍රි. ව. 1940 වර්ෂයේ ප්‍රචීන මධ්‍යම විභාගයෙන්ද ක්‍රි. ව. 1945 වර්ෂයේ ප්‍රාචීන අවසාන විභාගයෙන්ද සමර්ථවී හෙතෙමේ රාජකීය පණ්ඩිත උපාධි නාමය ලැබුයේ විය.

102, 103, 104. ක්‍රි. ව. 1999 කත්තික නම් වූ ඉල් මස 27 වැනි දින ගෞරව නාමයක් හෙතෙමේ ලැබිය. අතිගරු ජිනවස් යතින්ද්‍රයන් වහන්සෙ විසින් කල උදාර ප්‍රතිපත්ති ශාසන-යට ගෞරවය පිණිස සමස්ත අමරපුර සඞ්ඝ සභිකයන් වහන්සෙලා විසින් "පටිපත්ති සෝභන ගණපාමොක්ඛාචරිය" නම් වූ මේ ගෞරව නාමෝපාධිය උන් වහන්සෙලා අතිගරු ජිනවස් මහ තෙරුන් වහන්සෙට පිදූහ.

105. වස්සෙ ච ද්වෙ සහස්සම්හි - දිනෙ පඨම චිත්තම්හි,
රාමඤ්ඤ නිකායෙන - තථා අරියවිලාස.

106. වංසාලංකාර නාමෙන - සද්ධම්ම වාගිස්සරො ච,
සුවිසෙස මහොපඤ්ඤා - ගාරවං සහ පූජයී.

## 12. ගුණගන්ධ පුප්ඵ ගබ්භිත ධම්ම රසං

107. ලඞ්කාය සාසනික අබ්බුදකාරි කාලෙ-
ඨාමෙන ජෙත්ව යති ආගත මාරසෙනං,
අප්පිච්ඡතො ච විරියො සතිඤාණයුත්තො-
සබ්බත්ථ පත්ථට සමාහිත සීලගන්ධො.[19]

108. සම්බුද්ධ සාසන සමිද්ධි'මු'පෙක්ඛමානා-
අජ්ඣාසයො හවි සදාතන ථූල දෙහො,
සද්ධාලු ඛන්තිම වරො සුවචො වදඤ්ඤූ-
සො සූරතො'සි ධිති පූරිත බොධි සත්තො.

109. පාසාදිකො'පි හවි සබ්බි'රියාපථෙසු-
සන්තො සුසංවුත මුත්තම චිත්තදස්සී,
සාමඤ්ඤ ධම්ම මිගරාජ'ව පූරයිත්වා-
ආරඤ්ඤකො ච අමතො කුසලො ගවෙසී.

105, 106. එසෙම- දෙදහස් වර්ෂයේ චිත්ත නම් වූ බක් මස පළමු වැනි දිනයෙහි(ක්‍රි. ව. 2000. 04. 01) රාමඤ්ඤ නිකායික සඞ්ඝයා විසින් අරිය විලාස නම් ලත් වංසගත වූ එනම් ශ්‍රී ආර්‍ය විලාස වංසාකාර සද්ධර්ම වාගීස්වර උපාධීත් සමඟ තත් නිකායේ උත්තරීතර සුවිශේෂ මහෝපාධ්‍යාය නාමයෙන් පිදූහ.

## 12. ගුණ සුවඳ පිරි පුෂ්පයේ දහම් රසය

107. යතිවරයන් වහන්සෙ කසාවත පොරවා පාත්‍රයත් තල් ගොටු අත්තත් අතැතිව පැමිණි මාර සෙනාව වීර්‍යයෙන් ජයගෙන අල්පේච්ඡතාවය- ධෛර්‍යය සිහි ඥුවන යන මෙයින් යුක්ත විය. සැම තැන්හි පැතිරීගිය සමාහිත සීල සුගන්ධය ඇත්තේවිය.

108. සම්බුද්ධ සාසන සමෘද්ධිය හඟින්නාවූ නොනැසෙන අදහස් ඇති- සර්ව සම්පූර්ණ දේහ සම්පත්තියක් ඇති- ශ්‍රද්ධාවත් උතුම් ඉවසීමත් ඇති- යහපත් වචන ඇති- බොහෝ දේ දන්නා වූ පිරූ පාරමී ඇති වීර්‍යවන්ත මහා බෝධිසත්වයන් වහන්සෙ නමකි.

109. සුසංවූත සියලු ඉරියාපථයන්හි ප්‍රසාදය එළවන්නේද සත්පුරුෂ උත්තම චිත්ත දාර්ෂණික වූ ම ශ්‍රේෂ්ඨ මෘග රාජයෙක් මෙන් පිරූ ආරඤ්ඤක ශ්‍රමණ ධර්ම ඇති අමෘතය සහිත කුසල ගවේෂකයන් වහන්සෙ නමක්ද වූහ.

110. සුත්තාභි ධම්ම විනයෙසු ච සද්ද සත්ථ-
භාසාසු සක්කත'ධ සීහළ මාගධීසු,
බුද්ධිප්පභාව විසදො සුවිසුද්ධ පඤ්ඤා-
ථෙරො යතින්ද ජිනවංස වරො විභාසි.

111. අජ්ඣාපනෙන සකසිස්සගණං විනෙන්තො-
අම්හාකමා'චරිය පණ්ඩිත සාමි පාදො,
කාරුඤ්ඤ සුද්ධ හදයො සතතං පරෙසං-
වාසං අකාසි සුචිරං කරුණා දයාය.

112. ථෙරොසි පුබ්බ කත පුඤ්ඤ වරො විසෙසො-
රාමඤ්ඤවංස යතිසඞ්ඝපිතා සමානො,
සම්භාවනිය පරමො මම සාමි පාදො-
පුඤ්ඤාධිකාර පරමෙන චිරං විභාසි.

113. සම්පන්න සීල මිතභාණී සුසංයමො ච-
සංසුද්ධ සච්චරිත ලක්ඛණ සුද්ධ ජීවී,
ථෙරො ගරුත්තම සුගාරව සම්පයුත්තො-
සම්පූරයී අමිත පාරමිතා බලඤ්ච.

114. නා නා දිසාසු ගත පත්ථට අස්සමෙසු-
යොගීන යොග කරණෙ සතතං නියුත්තො,
කත්තබ්බ කිච්ච විසයෙ සතිමා සරන්තො-
අට්ඨාසි ථෙර යති ගල්දූව යොගරාමෙ.

.

110. සූත්‍ර අභිධර්ම විනය යන ත්‍රිපිටකයෙහි ද, සද්ද ශාස්ත්‍රයෙහි ද, සංස්කෘත සිහළ පාළි යන භාෂාවන්හි ද, පැතිරී ගිය බුද්ධි ආලෝක ඇති විසුද්ධ ප්‍රඥා ඇති උතුම් වූ ජිනවංස මහා යතිවරයන් වහන්සේ මෙලොව බැබලුණේ ය.

111. අධ්‍යාපනයෙන් ස්වකීය ශිෂ්‍ය සමූහයා හික්මවන්නා වූ මාගේ ආචාර්යයෝත්තම පණ්ඩිත ස්වාමිපාදයන් වහන්සේ නිරන්තරයෙන් අන් අයට පිරිසිදු කරුණා හදවත් ඇති උන් වහන්සේ, කරුණා දයාවෙන් බොහෝ කාලයක් වාසය කළ සේක.

112. පූර්ව ජාතීන් හි කළ උතුම් පින් ඇති තෙරුන් වහන්සේ රාමඤ්ඤ මහා නිකායෙහි මහා සංඝ පීතෘවර සමාන උතුම් සම්භාවනීය වූ සේක. මාගේ ස්වාමිපාදයාණෝ උතුම් ප්‍රාර්ථනා සහිත පින් බෙලෙන් බොහෝ කාලයක් වැඩසිටි සේක.

113. පරිපූර්ණ සිල් ඇති පමණ දැන කථා ඇති මනා සංවර ඇති පිරිසිදු චරිත ලක්ෂණ සහිත පිරිසිදු ආජීව ඇති ගෞරව සම්ප්‍රයුක්ත වූ උතුම් තේරපාදයන් වහන්සේ මිල නොහැකි තරම් පාරමී බල පිරූ සේක.

114. නොයෙක් දිශාවන්හි පැතිරී ගිය ආශ්‍රම යන්හි වැඩ සිටින යෝගීන්ගේ යෝග කරණයෙහිලා නිරන්තරයෙන් යෙදුණු කළ යුතු සහ කටයුතු විශයෙහි මනා සිහි ඇත්තෙක්ව සිහි කරමින් යතිවරයන් වහන්සේ ගල්දූව යෝගාශ්‍රමයෙහි වැඩ සිටි සේක.

115. ගොතම සාසන වුද්ධි'පි කාතුං-
අත්ත විමුත්ති පසොධන තාය,
සුද්ධ මුඛෙ සක චිත්ත ඨපෙතුං-
තානි භවිංසු යතිස්ස හි චෙතං.[20]

116. පුඤ්ඤ ගතෙන'තුලො වපු දන්තා-
සාසන ධාර මුඛම්පි සපත්තා,
ලොකහි මජ්ඣගතො සමණින්දා-
දුක්ඛ විනා සුඛ ඨාන මුපෙසී.

117. සක්ක උජූ ච හි දුබ්බල ඨානෙ-
සො සුවචො භවි දුබ්බච ඨානෙ,
සල්ලහුකො'පි අසල්ලහු ඨානෙ-
මොදනකො'සි අමොදන ඨානෙ.

118. ලුබ්භනකො න'සි ලුබ්භනකානං-
දුස්සමනො න'සි දුස්සිතකානං,
විජ්ජතරො භවි මොහතරානං-
උණ්ණතිතො අති මානතකානං.

119. මෙත්තබලො සිවි සාතකමජ්ඣෙ-
කාරුණිකො'සි අකාරුණිමජ්ඣෙ,
සො මුදිතො'සි අමුද්දිතමජ්ඣෙ-
මජ්ඣමනො'සි අමජ්ඣකමජ්ඣෙ.

115. ශ්‍රී ගෞතම බුදු සසුන නගා සිටුවීමත් ආත්ම විමුක්තිය පිරිසිදු කර ගැනීම සඳහා පිරිසිදු අභිමුඛයෙහි ස්වකීය සිත තැබීමටත් යන මේ සිතිවිලි වනාහි යති වරයන් වහන්සෙගේම වූහ

116. පිනෙන් පිරුණු අන් අයට අසමාන වූ දමනය කරගත් ඉන්ද්‍රිය ඇතිව දේහ සම්පත්තියක් ඇතිව බුද්ධ සාසනස්ථාන මුඛයට මනාව පැමිණියා වූ ලෝකයා මැද ගමන් ගත් සමණින්ද්‍රයන් වහන්සෙ දුක අතහැර සැපස්ථානය වෙත සුවපත්ව වැඩිසේක.

117. දුර්වල ස්ථානයෙහි වනාහි සමර්ථයෙක්ද ඍජු පැවතුම් ඇත්තෙක්ද විය. අකීකරු ස්ථානයෙහි වනාහි හෙතෙමේ යහපත් වචන ඇතිව සුවච කීකරු විය. සැහැල්ලු පැවතුම් නොකල හැකි ස්ථානයේ සැහැල්ලු පැවතුම් ඇත්තෙක් විය. අසතුටු සිත් ඇති ස්ථානයෙහි සතුටු සිත් ඇත්තෙක් වූ සේක.

118. ලොභ ඇත්තවුන් අතුරෙන් හෙතෙමේ නිර්ලෝභී වූ සේක. දූසිත සිත් ඇත්තවුන් අතුරෙන් හෙතෙමේ පිරිසිදු සිත් ඇති සේක. මෝහ තර වූවන් අතුරෙන් විජ්ජාතර උතුමෙක් වූ සේක. මාන ඇත්තවුන් අතුරෙන් නිහතමානී වූ සේක.

119. දොස සිත් ඇත්තහු මැද මෛත්‍රී බල ඇති සේක. අකාරුණික වුන් මැද කරුණාබල ඇති සේක. අමුදිත වුන් මැද මුදිතා බල ඇති සේක. ඇලීම් ගැටීම් ඇත්තවුන් මැද මැදහත් සිත් ඇති සේක.

120. මච්ඡරිනො නනු මච්ඡරිකානං-
සොචනනො න'සි සොචිතකානං,
නො අවමාන'වමානපිකානං-
උම්මදකො න'සි උම්මදකානං.

121. ථාවරකො'සි අථාවරකානං-
සො සති භාව'පි අස්සතිකානං,
ඛන්තිබලො'සි අඛන්තිකකානං-
ඤාණබලො භවි මන්දපිකානං.

122. සප්පුරිසො'සි අසප්පුරිසානං-
ලක්ඛිවරො'සි අලක්ඛිකකානං,
සච්චරිතො භවි නිච්චරිතානං-
ලොකවරො ච තථාගතකානං.

123. සච්චසුවාදි අසච්චකකානං-
වීරවරො භවි වීරවරානං,
කිත්තිතරො භවි කිත්තිවරානං-
පුඤ්ඤතරො භවි පුඤ්ඤවතානං.

120. මසුරු මල ඇත්තවුන් අතුරෙන් හෙතෙමේ මසුරු මල නැත්තේ නොවේද? සෝ තැවුල් ඇත්තවුන් අතුරෙන් සෝ තැවුල් නැත්තෙක් විය. අවමාන ලබන්නවුන් අතුරෙන් අවමාන නොලබන්නෙක් නොවේද? කෙලෙස් බරින් උමතු වූවන් අතුරෙන් උමතු නොවූ කෙනෙක් නොවේද?

121. ස්ථාවරත්වයක් නැත්තවුන් අතුරෙන් හෙතෙමේ ස්ථාවර පැවතුම් ඇත්තෙක් වූ සේක. සිහි මුලාවූවන් අතුරෙන් හෙතෙමේ සිහිය ඇත්තෙක් වූ සේක. ඉවසීම නැත්තවුන් අතුරෙන් හෙතෙමේ ඉවසීමේ බල ඇත්තෙක් වූ සේක. නුවණ මඳ වූවන් අතුරෙන් ඥාණ බල ඇත්තෙක් වූ සේක.

122. අසත් පුරුෂයන් අතුරෙන් හෙතෙමේ සත්පුරුෂ ගුණ ඇති උතුමෙක් වූ සේක. වාසනා මහිමයක් නැත්තවුන් අතුරෙන් වාසනා මහිමය පිරි උතුමෙක් වූ සේක. නින්දිත චරිත ඇත්තවුන් අතුරෙන් යහපත් චරිත ඇති උතුමෙක් විය. තථාගත නම් වූ සත්වයන් අතුරෙන් ලෝ වැඩ සැලසූ උතුමෙක් වූ සේක.

123. අසත්‍ය වාදීන් අතුරෙන් සත්‍යවාදී ගුණ ඇති උතුමෙක් වූ සේක. වීර්යය ඇත්තවුන් අතුරින් උතුම් වීර වරයෙක් වූ සේක. කීර්තිය ඇත්තවුන් අතුරෙන් තර වූ කීර්ති ඇති උතුමෙක් වූ සේක. පින් ඇත්තවුන් අතුරෙන් තර වූ පින් ඇති උතුමෙක් වූ සේක.

124. රක්ඛිත සො නනු වො භවි තාතො-
පොසිත සො විය වො උපමාතා,
බොධි ජනො නනු නෙකජනානං-
තුම්හ භවිස්සතු බොධිසු ඤාණං.

125. ලොකහි ජාත සරෙ අරවින්දො-
සො ජිනවංස මහා නර වින්දො,
නෙක සහස්සහි තාත තුවම්පි-
දෙව භවං ගමි සබ්බ පහාය.

### 13. ගුණගන්ධ පුප්ඵ නිට්ඨිත කාලං

126. කාරුඤ්ඤ සීතල මනො යති නෙතු ථෙරො-
ධීරො උදාර මතිමා ථීර භාව පත්තො,
ආරඤ්ඤකො නිඛිල සාසන වුද්ධිකාමො-
කාරෙසි'නූන'මිත සබ්බ මහොපකාරං.

129. සො ද්වෙ සහස්ස සරදෙහි අථාපි තීණි-
ආසාළ්හ තෙරස'හ පණ්ණරසී මුහුත්තෙ,
ඛණතොපි තිංසති තියාම දසම්පි හොරා-
සො සම්පජානහි සතො තිදිවංගතොසි.

124. හෙතෙමේ අපව ආරක්ෂා කළ සාසනික පිය කෙනෙක් නොවන්නේද- වන්නේමය. හෙතෙමේ අපව පෝෂණය කළ උපමාතාවක් නොවේද- වන්නේමය. හෙතෙමේ අනේක ජන සමූහයාගේ බෝසත් උතුමෙක් නොවේද- වන්නේමැයි. එබැවින් ඔබ වහන්සෙ උතුම්වූ ලොව්තුරු බෝධි ඥාණය ලබන සේකවා!

125. හෙතෙමේ ලෝකය නැමැති විලෙහි හටගත් අරවින්දයක් බඳු වූ සේක. ඒ ජිනවංස මහා නරවින්දයන් වහන්සෙ නොයෙක් සිය දහස් ජනයා කෙරෙහි පිය කෙනෙක් වූ සේක. උන් වහන්සෙ සියල්ල අතහැර තුසිත දෙව්ලොවට වැඩි සේක.

## 13. විකසිත පුෂ්පයේ නිමාව

126. කරුණා සීතල සිතින් යුත් නායක තෙරුන් වහන්සේ ධීර වූ උදාර ප්‍රඥා ඇති ස්ථිර බවට පැමිණියාවූ ආරණ්‍ය වාසීව නිර්මල සාසන වෘද්ධි කැමැත්තා වූ හෙතෙමේ අනූන අපරිමිත සියලු මහෝපකාරයන් අප වෙත කරවීය.

129. ක්‍රි. ව. 2003 වැනි වර්ෂයේ වනාභි උදාවූ ඇසළ මස 13 වැනි දින පුර පසළොස්වක් පෝදා රාත්‍රී පැය 10 කුත් විනාඩි 30 කින් හෙතෙමේ සිහි නුවණින් අපවත්වී දෙව්ලොව වැඩි සේක.

130. සොතිණ්ණ'සීති අභිනික්ඛමතොපි වස්සං-
වස්සං ච සත්ත උපසම්පදතො විහාසි,
ජීවිතඤ්ච ඡණ්ණවුති හායන ජාතිතො'සි-
ථෙරො යතින්ද පරලොක මිතො ගතොති.

131. ථෙරස්ස විප්පගතභාව මහා යතින්ද-
ආරොචයී සකල දීප නරාන කානං,
නිස්සාය තාව අවසෙස ගණස්ස භික්ඛූ-
කන්දිංසු තෙපි පපතිංසු විලාපයෙහි.

132. නානා විධානි කුසුමානි සුගන්ධ මාලා-
ආදාය නෙක සත චීවර සෙස සබ්බෙ,
ආගම්ම යත්‍ර මතකාය පසත්‍ර නෙතු-
සබ්බෙ'පි පූජය යතිස්ස ගුණ'ණ්ණවාය.

130. ඒ උතුමන් වහන්සෙ ප්‍රථමාභිනිෂ්ක්‍රමණයේ සිට පුරා වර්ෂ 83 ක් විය. උපසම්පදාවෙන් වස් 76 ක් විය. උප්පත්තියෙන් වර්ෂ 96 ක් ආයුෂ ඇතිව වැඩ වාසය කළ සේක. එසෙ ආයු වැළඳූ ඒ තෙර යතිවරයාණන් වහන්සෙ මෙයින් චුතව පරලොව වැඩි සේක.

131. යතිවර මහා ථෙර පාදයන් ගේ විප්පගත බව සියලු සීහල දීප වාසී නරයන්ට දැනුන් දුන්නේය. තවද සෙසු භික්ෂු සමූහයාටද දැනුම් දුන්නේය. ඔවුහු (සියල්ලෝම) හැඬූහ. විලාප දෙමින් බිම පතිත වූහ.

132. නා නා විධ කුසුම් හා සුවඳ මල් අදියත්, නොයෙක් සිය ගණන් චීවර සහ සෙසු පිරිකර රැගෙන ප්‍රශස්ථ ගුණ ඇති තේතෘන් වහන්සෙගේ මෘත ශ්‍රී දේහය යම් තැනෙක්හිද එතනට සියළුම දෙනා පැමිණ උන් වහන්සෙගේ ගුණ ගංභා ගයමින් සියළු පූජා වලින් පිදුවාහුය.



133. ගත්තං සුවණ්ණ සිවිකාය නිරොපිතං තං-
ආකිණ්ණ තෙ ජනපජා ච සහත්ථ පූජා,
යාව’ඤ්ඤසම්පි ධජකෙහි අලංකරිත්වා-
තෙසුං’පි යත්ථ ඨපිතුං චිතකා’පි ගාරං. ෴

134. සෙනාබලං තිවිධකෙහි ගරුහි සද්ධිං-
සංවිජ්ජ තං නගර’මම්බලනෙගාධ* ඹෙතෙන,
මාලාලතාකරණපුප්ඵවිලාසචිත්තං-
සම්පාපුණිංසු සිරිදෙහ සපීත වණ්ණං. ෴

135. නා නා දිසාසු මහිපාල මහා යතීහි-
ලොකාච නෙක සත ආදි සමාගමිංසු,
පබ්‍යාකරිත්ථ ගුණ තෙහි බලං මහන්තං-
තෙ වෙඨයිංසු මන සොක ඝනන්ධකාරා. ෴

136. බුද්ධස්ස දෙහ මි’ච තං කත සාධු පූජං-
ඔදාත චන්දන’පි කප්පූර තෙල පුණ්ණං,
කත්වාන හද්ද චිතකම්පි පසාද වණ්ණං-
ආරොපයිංසු සිරි ථෙර වරස්ස දෙහං. ෴

137. බුද්ධංකුරස්ස වපු ජාලය මාන කාලෙ-
අස්සාසිතුං ජනගනං සමලං සසොකං,
අග්ගඤ්ඤ සො අරියධම්ම සසඞ්ඝ නෙතු-
දෙසෙසි ධම්ම මරණං හදයඞ්ගමාය. ෴

* නගර’මම්බල**න්ගො**ධ - “න්ගො” අකුරු දෙක ගුරු අක්ෂරයක් ලෙස භාවිතා වේ

133. ශ්‍රී දේහය තැන්පත් කළ රන් සිවි ගෙය වනාහි ගැවසීගත් ජනප්‍රජාවද පූජා ආදිය අතැතිව සිටි ජනප්‍රජාව යම් තාක්ද ඒ තාක්ම මාර්ග දෙපස ධජ පතාක වලින් අලංකාර කොට ශ්‍රී දේහය තැබිය යුතු චිතකාගාරය යම් තැනෙක්හිද එතනට උත්සව ශ්‍රීයෙන් පැමිණියහ.

134. ත්‍රිවිධ සෙනාබල ඇණිය විසින් කළ උත්තමාචාරය සමඟ අම්බලන්ගොඩ නගර ක්ෂේත්‍රයේ විද්‍යාමාන වූ මාලාකර්ම ලතා කර්ම කල කාසාව වර්ණ සහිත පුණ්‍ය විලාස චිතකය වෙත ශ්‍රී දේහය ඔවුහු ගෙනාහ.

135. නොයෙක් දිශාවන්හි සිටි අමත්‍යාදීන් මහා යතිවරයන් වහන්සෙලාත් නොයෙක් සිය ගණන් රට වැසියෝත් ආදී පිරිස එහි පැමිණියාහ. ඔවුහු විසින් උන්වහන්සෙගේ ගුණ බල මහත්තතාවය ප්‍රකාශ කරන්නාවූ රුස්ව සිටි ඇත්තවුන්ගේ සිත් සෝ අන්ධකාරයෙන් වෙන් වූනාහ.

136. බුදු රජණන් වහන්සෙගේ ශ්‍රී දේහයට මෙන් කරන ලද සාධු පූජා ඇත්තේ විය. (එනම්) සුදු සඳුන්ද, කපුරු සහ සඳුන් තෙල් පිරවූ ප්‍රසාද වර්ණ භද්‍ර චිතකයක් කර ඒ තුලට ශ්‍රී ථේරපාදයන්ගේ ශ්‍රී දේහය ඔවුහු නැංවූහ.

137. බුද්ධාංකුරයන් වහන්සෙගේ ශ්‍රී දේහය දල්වන කාලයෙහි කෙලෙස් මල සහිත සෝ ගිනි සහිත සිටි ජන සමූහයා අස් වැසීම සඳහා ගරු අරියධම්ම යතිවරයන් වහන්සෙනම්වූ සඞ්ඝයාට නායක වූ ශ්‍රේෂ්ඨ වූ තෙරුන් වහන්සෙ මෙත් කරුණාවෙන් පිරිපුන් හෘදයාංගම සිතින් මරණානුස්සතිය දේශනා කළ සේක.

138. හස්මා'වසෙස පරිපුණ්ණ කරණ්ඩකෙන-
සඞ්ඝස්ස අස්සම පදා'හරි උස්සවෙහි,
චෙතිම්පි කත්වා නිදමෙසි'පි ථූප ගබ්භෙ-
වන්දන්ති තස්ස සිරසා'භි සදා සදෙවා.

## 14. අභිවාදන පත්ථනා

139. කල්‍යාණ මිත්ත පරමො සුගතස්ස පුත්තො-
සුත්වාන තස්ස මධුරං සුපසත්ථ ධම්මං,
සබ්බජනා දමිත මානස කෙහි සාමිං-
පත්ථිංසු තෙ'පි සිරසා'භි නමිත්වා මෙවං.

140. අත්තං මනුස්ස පවිභාය මිතො චවිත්වා-
ගච්ඡිම්පි සො තුසිතකෙසු'පි දෙව කායං,
පූරෙත්වා පාරමිත ධම්ම තිධාභි කාරං-
සම්බොධි පාපුණතු මාර පරාජයිත්වා.

141. දානාදි මුත්ත පරියෙසන සම්පයුත්තො-
පක්ඛී කලන්දක මහිංසක පාණකානං,
දත්වා සකිච්ච පසුතො'දන බජ්ජ පානං-
ඉච්ඡාම'හං'පි පනිධී කත බුද්ධ භාවා.

142. එතන්තරෙ විවිධ බාහිර වත්ථු පූජා-
සී'ස'ක්ඛි ලොහිත සමංස ච පුත්ත දාරෙ,
රජ්ජං ච ජීවිත වරම්පි ජනස්ස දත්වා-
සබ්බඤ්ඤු බොධි'මධි ගච්ඡතු ථෙර පාදං.

138. ඉතිරි වූ භස්මාවසෙස ධාතු පිරවූ කරඬුවකින් උත්සව ශ්‍රීයෙන් වනාහි සඞ්ඝයාගේ ආශ්‍රම පද වෙත ගෙනාවේය. එහි චෛතියක් කොට ථූප ගර්භයෙහි මාහිමි භෂ්මාවසෙස ධාතු නිධන් කළේය. උන් වහන්සෙට සැම කල්හි දෙවියන් සහිත ලෝකයා සිරසින් අභි වන්දනා කරත්.

## 14. අභිවාදන ප්‍රාර්ථනා

139. උතුම් කල්‍යාණ මිත්‍ර වූ සුගතයන් වහන්සෙගේ පුත්‍ර වූ ඔබ වහන්සේගේ ප්‍රසංසනීය මධුර ධර්මය ඇසූ දමිත සිත් ඇති වූ සියළු ජනයෝ වනාහි ඒ ගරු ස්වාමීන් වහන්සෙට සිරසින් අභිවාදනය කොට ඔවුහු මෙසෙ ප්‍රාර්ථනය කරන්නාහ.

140. හෙතෙමේ මනුෂ්‍යයාත්ම භාවය අතහැර මෙයින් චුතව තුසිත දෙව්ලොව වැඩියේය. ස්වාමීනි ඔබ වහන්සෙ විශේෂයෙන් ත්‍රිවිධාකාර වූ පාරමිතා ධර්ම පූරා මාර පරාජය කොට උතුම් සම්බෝධියට පැමිණෙන සෙක්වා!

141. මිදුනු මසුරු සිතින් යුක්ත වූ හෙතෙමේ අහිංසක පක්ෂි, ලෙහෙන්නු ආදී සත්වයන්ට බත්, කැවිලි, පානීය ජලයාදී දන් දීම යන ස්වකීය කෘත්‍යයෙහි නියුක්ත වූ හෙතෙමේ ප්‍රාර්ථනා කරන ලද බුදු බව ඇත්තේ යැයි මම සිතමි.

142. ඒ අතර තුර දී විවිධ වූ බාහිර වස්තු පූජාවන්ද හිස් ඇස් ලේ මස් සහිත තම ජීවිතයද අඹුදරුවන්ද රාජ්‍යයද යන සියල්ල ජනප්‍රජාවට දන්දී ථෙර පාදයන් වහන්සෙට සර්වඥතාඥාණය අවබෝධ වේවා!

143. නෙතුත්තමො සුගත අඤ්ඤජ සත්ත සාරො-
පාතීව මොක්ඛ වර සංවර සුද්ධ සීලා,
සික්ඛානු සික්ඛහි සජීවිත දාන හෙතු-
නාතික්කමිත්ව චමරීව සුරක්ඛි වාලං.

144. පුබ්බෙ භවෙසු කත පාරමිතා බලෙන-
සො පඤ්ච කාමගුණිකෙසු අනාලයිත්වා,
මාතා  පිතා ච රුදතෙ පවිහාය සබ්බෙ-
නෙක්ඛම්ම කාරක අපූරයි පබ්බජිත්වා.

145. ගන්ථාකරාදි පරිවෙණ’ඛිලං පහාය-
නෙක්ඛම්මසො දුතිය වාර වසෙන මෙවං,
යොගස්සමඤ්ඤ සුකතං අවසාන කාලෙ-
සබ්බං විනා තතිය වාර වසෙන පූරී.

146. තිපිටකෙසු කුසලො පටිපත්ති ඡෙකො-
ඤාණෙන සඞ්ඛත තිභංග සභාව කානං,
ජානිත්ව සබ්බ විධමෙත්ව පහාය මොහා-
පඤ්ඤාව කාරක අපූරයි බොධිසත්තො.

147. සංසාර සාගර ජලං තරිතුම්පි වීරො-
පාපන්ධකාර නිකරං විධමෙත්ව ථාමො,
සබ්බම්පි තං පණිධිතාය කතොසි මෙවං-
බුද්ධං කුරො විරිය පාරමිතානුපූරි.

143. මනාව ගිය මාර්ග ඇති නේතුත්තම සත්ව සාරයන්
වහන්සෙ, පිරිසිදු වූ උතුම් ප්‍රාතිමෝක්ෂ සංවර සීලය වනාහි
කුඩා අනු කුඩා සික පද- තම වල්ගය රකින සෙමෙර මුව
මෙන් ජීවිත පරිත්‍යාග හේතුවෙන් නො ඉක්මුවේය.

144. පූර්ව භවයන්හි පූරණය කරණ ලද පාරමිතා බලයෙන්
හෙතෙමේ, පඤ්චකාම ගුණයන් (ගුණිකයන්) කෙරෙහි
නො ඇලී මව්පියන් හඬනා කල්හි සියල්ල අතහැර පැවිදි
නෙක්ඛම්ම පාරමිතාව පිරුවේය.

145. ග්‍රන්ථාකාර පිරිවෙණ ආදී සියල්ල අතහැර හෙතෙමේ
මෙසෙ දෙවන වාර වශයෙන් නෙක්ඛම්ම පාරමිතාව
පිරුවේය. මනාව මාපිත කල යෝගාශ්‍රම සංස්ථාවක්
(පරීක්ෂාකාරාදි) සියල්ලන් අවසාන කාලයේදී අතහැර
තුන්වන වාර වශයෙන් හෙතෙමේ නෙක්ඛම්ම පාරමිතාව
පිරුවේය.

146. ත්‍රිපිටකයෙහි දක්ෂ වූ ප්‍රතිපත්තියෙහි ඡේක වූ සංඛතාදි
ස්වභාව ධර්මයන්ගේ භංග තාවය නුවණින් දැන සියල්ල
දුරුකර මෝහ අතහැර ඒ බෝධි සත්වයන් වහන්සෙ ප්‍රඥා
පාරමිතාව පූරණය කළේය.

147. වීරයන් වහන්සෙ සංසාර ජල සාගරය තරණය කිරීම
සඳහාත් ඒ ථාමයන් වහන්සෙ පාපාන්ධ ආකාර සමූහය දුරු
කොට මෙසෙ ඒ සියල්ල කරන ලද්දේ බුද්ධ ප්‍රාර්ථනාව
සඳහාය. බුද්ධාංකුරයන් වහන්සෙ වීර්‍ය පාරමිතාව මෙසෙ
පිරුවේය.

148. ඛන්තිඤ්ච මෙව ම’ධිලං කටුකඤ්ච ඝොරං-
යොගස්සමඤ්ච මභිධාන සුදීප ජාලං,
දිස්වාන සාසනවරස්ස හි ජාලිතො සො-
ඛන්තීවරො නනු පාරමී ඛන්ති පූරි.

149. යො සච්ච පාරමී වරො මුනිරාජ පුත්තො-
ආකූලට්ඨාන විධමෙසි ජින සාසනස්ස,
වාචාය සච්ච පටිපත්ති මුදාර කාමො-
සම්බොධි ඤාණ ගමනාය සුපූරි සච්චං.

150. සාවජ්ජ නීච පරවාද පහාය භූරි-
සම්බුද්ධ ධම්ම මුදයං අභිඉච්ඡමානො,
අම්හම්පි ආචරිය ථෙර’පි චිත්ත දස්සී-
දළ්හං මට්ඨීත වරං වත නො ජගාසී.

151. මෙත්තා විහාර පරමො’පි දයානු කම්පී-
සම්පූරිතො ගුණ’මීලො පරිභාවිතො සො,
සිස්සෙහි සම්පරිවුතො අරඤ්ඤෙ වසන්තො-
මෙත්තඤ්ච සම්ඵරි සමං නනු ලොක සත්තෙ.

152. ආලම්පිනාල මනුපෙච්ච’පි නාලයිත්වා-
භාවෙසි චිත්තසම සාධු අසාධුකානං,
මජ්ඣත්තකාර වරඤාණ බලෙන දස්සී-
එසො චිරම්පි වජිරං භවි සම්මුපෙක්ඛං.

148. සියලු ඝෝර කටුක දුක් ඉවසාගෙන යෝගාශ්‍රම නමින් සුදීපය ජාලයක් දැල්වූ හෙතෙමේ බුදු සසුනට උතුම් දායාදයක් කළ ක්ෂාන්ති වරයන් වහන්සෙ ක්ෂාන්ති පාරමිතාව පිරුවේ නොවේමද? පිරුවේමය.

149. උතුම් වූ සත්‍ය පාරමී ඇති මුනිරාජ පුත්‍ර වූ යමෙක් වේද? හෙතෙමේ ජින ශාසනයාගේ අවුල් වියවුල් තැන් දුරු කළේය. සත්‍ය වචනයෙන්ද උදාර වූ සත්‍ය ප්‍රතිපත්ති කාමීත්වය ඇති හෙතෙමේ උතුම් සම්බෝධි ඤාණාධිගමය පිණිස සත්‍ය පාරමිතාව මනාව පිරුවේය.

150. නීච වූ වැරදි සහිත පරවාද අතහැර සම්බුද්ධ ශාසනාභිවෘද්ධිය කැමති වන්නාවූ ඥාණවන්තයන් වහන්සෙ චිත්තදර්ශී මාගේ උපාධ්‍යාන් වහන්සෙ උතුම් දැඩි අධිෂ්ඨාන පාරමිතාව ඒකාන්තයෙන්ම නො අත්හලේය.

151. දයානුකම්පා ඇති උතුම් වූ මෛත්‍රී විහාර ඇති අමිල ගුණයන්ගෙන් පිරුණු භාවිත සිතක් ඇති හෙතෙමේ ශිෂ්‍යයන් පිරිවරන ලදුව ආරණ්‍යයේ වැසූ ඔබ වහන්සෙ සියළු සතුන් වෙත සම සිත පැතුරුවේ නොවේමද? වේමැයි.

152. හෙතෙමේ ඇලීම-නො ඇලීම යන දෙකෙහිම නො ඇලී (නොගැටී) සත් පුරුෂ අසත් පුරුෂ සියල්ලන්ට සම සිත වැඩුවේය. මධ්‍යස්ථාකාර වූ උතුම් ඤාණ බලයෙන් දාර්ශී වූ උන් වහන්සෙ වජිර පව්ව මෙන් බොහෝ කාලයක් උපේක්ෂා පාරමිතාව පිරුවේය.

153. ථෙරාසභො නියත මග්ග පතෙ නියුත්තො-
ආගච්ඡ ත්වං ඉධ තතො සහසා චජිත්වා,
ඨත්වා සිවං තිදස පාරමී පූරයිත්වා-
නිය්‍යාය තුභි සකලෙ සුගතො'පි හුත්වා.

## 15. සෙවිත ගන්ථ නාමාවලී

154. ආවජ්ජනා'පි සමරූ කලබ්භුව නාමං-
භාසාය සීහල කතම්පි වනං පවත්තිං,
ගන්ථං මධුව චරිතං ගුණවන්නිතං තං-
එතානි පාවචන සබ්බ ගරුම්පි කත්වා.

155. පණ්ණාස එක සත අට්ඨ'ධිකා ච ගාථා-
මත්තම්පිතං රචිතමෙ'කක භාණවාරං,
පිණ්ඩත්ව විස්සත සුකිත්ති ගුණං මහන්තං-
පජ්ජෙහි ථෙරම'පදාන ම'හං කතොම්හි.

153. නියත සම්බෝධි මාර්ග පථයෙහි නියුක්ත වූ ථේරාසභයන් වහන්සෙ ඔබ වහන්සෙ! ඉක්මනින් එයින් චුතව මෙහි එන සෙක්වා! මෙහි සිට වනාහි තිස් ආකාර පාරමිතාවෝ පූරණය කර සුගත තථාගත යන් වහන්සෙ නමක් වී සකල සත්වයන් නිවනට පමුණුවාවා!

## 15. පාදක ග්‍රන්ථාවලිය

154. සීහල භාෂාවෙන් කරන ලද සමරු කළඹ නම් වූ (අඩ සිය වසරක) ආවර්ජනා ග්‍රන්ථය ද, විසි වසරක යෝගාශ්‍රම ඉතිහාසය ඇතුලත් වන පවත නම් ග්‍රන්ථයද, තත් තෙරුන් වහන්සෙ ගේ ගුණ වර්ණනා කල චරිත මධු නම් ග්‍රන්ථයද යන මෙවාත් පාලි භාෂාවත් යන සියල්ල ගුරු කොට;

155. ගාථා 50 කුත්, ගාථා 100 ක්, තව ගාථා 08 ක් අධික වශයෙන් (වර්ණ 7632),රචනාකල මේ ග්‍රන්ථය එක් බණවරයක් පමණ විය. මෙසෙ බණවරකට ආසන්නව පිඩුකොට පැතිරී ගිය කීර්තිමත් ගුණ මහන්තතාවයක් ඇති ථේරාපදානය පාලි පද්‍ය වලින් මම සකස් කරන ලද්දේ වෙමි.

## 16. පුඤ්ඤානුමොදනා

156. එත්තාවතාව චිත පුඤ්ඤ බලෙන සද්ධිං-
මාතා පිතා නිඛිල බන්ධු මමං ගරූ ච,
අත්තාධිවත්ථ තිදසාව සබ්‍රහ්ම රාජා-
මොදන්තු කාලකත ඤාති හිතත්ථී සබ්බෙ.

157. ඉමිනා පුඤ්ඤ තෙජේන-
කතෙන ධම්ම චිත්තෙන,
චිරං තිට්ඨතු ලොකස්මිං-
සම්මා සම්බුද්ධ සාසනන්ති.[21]

158. තස්මා මයා සුගතවංස’පි භික්ඛුනායං-
භාසාය මාගධි පණීත නිබන්ධනං තං,
ව්‍යාපාරිතො රචිත චිත්ත පසාදිතෙන-
ථේරාපදාන සුගමම්පි සුනිට්ඨිතං හි.[22]

සාධු! සාධු! සාධු!

නිට්ඨිතං.

## 16. පුඤ්ඤානුමෝදනාව

156. මෙසෙ මෙපමණකින් රැස් කර ගන්නා ලද සියළු පින් බලයෙන් මව්පියෝ ද, සියළු ඤාතීහුද, ආත්මාරක්ෂක දෙවියෝද, බ්‍රහ්ම රාජයෝ සහිත සියල්ලෝද (සුවපත් වෙත්වා!), කාලකත සියළු ඤාති හිතවත් සියළු සත්වයෝද, යන මොවුහු අනුමෝදම් වෙත්වා!

157. දහම් සිතින් කළ පුණ්‍ය තෙජසින් බුදු සසුන ලොවෙහි බොහෝ කළක් යහතින් පිහිටාවා!

158. එබැවින් සුගතවංස භික්ෂුව වූ මා විසින් මාගධ භාෂාවෙන් රචනා කරන ලද යම් ග්‍රන්ථයක් වේද? මෙහෙයවන ලද්දාවූ චිත්තප්‍රසාදයෙන් සුබාවබෝධය පිණිස ප්‍රනීත ඒ ථේරාපදාන නම් වූ ග්‍රන්ථය මෙතැනින් නිම කරන ලද්දේ විය.

සාධු! සාධු! සාධු!


නිමි.


# 17. රුදී මතක සටහන්






























# 18. උපග්‍රන්ථය

## මෙම ග්‍රන්ථයේ දැක්වෙන ගාථාවන්ට අදාල වෘත්ත සටහන් මෙසේය.

**01. "මාලිනී" වෘත්තය**

**නනමයයයුතායං මාලනී භොගිසීහි**

- - - / - - - / ∪ ∪ ∪ / - ∪ ∪ / - ∪ ∪

**02. "ඉන්ද්‍රවජ්‍ර" වෘත්තය**

**ඉන්ද්‍රාදිකා තා වජිරා ජගාගො**

∪ ∪ - / ∪ ∪ - / - ∪ - / ∪ ∪

**♦ "උපෙන්ද්‍රවජ්‍ර" වෘත්තය**

**උපාදිකා සා'ව ජ,තා ජ,ගා ගො.**

- ∪ - / ∪ ∪ - / - ∪ - / ∪ ∪

**03. "උපජාත" වෘත්තය**

**i. අනන්තරො'දීරිත ලක්ඛණා චෙ, (උපෙන්ද්‍රවජ්‍ර)**

- ∪ - / ∪ - - / - ∪ - / ∪ ∪

**ii. පාදා විමිස්සා උපජාතියො තා; (ඉන්ද්‍රවජ්‍ර)**

∪ ∪ - / ∪ ∪ - / - ∪ - / ∪ ∪

**iii. එවං කිල'ඤ්ඤාසුපි මිස්සිතාසු, (ඉන්ද්‍රවජ්‍ර)**

∪ ∪ - / ∪ ∪ - / - ∪ - / ∪ ∪

**iv. වදන්ති ජාතිස්විද' මෙව නාමං. (උපෙන්ද්‍රවජ්‍ර)**

- ∪ - / ∪ - - / - ∪ - / ∪ ∪

**04. "භුජඞ්ගප්‍රයාත" වෘත්තය**

**භුජඞ්ගප්පයාතං භවෙ වෙදයෙහි**

- ◡ ◡ / - ◡ ◡ / - ◡ ◡ / - ◡ ◡

## 05. "වසන්ත තිලකා" වෘත්තය

**වුත්තා වසන්තතිලකා තභජා ජගාගො**

◡ ◡ - / ◡ - - / - ◡ - / - ◡ - / ◡ ◡

## 06. "විසම" වෘත්තය

i. ◡ ; ◡ - ◡ / - ◡ ◡ / ◡

ii. ◡ ; ◡ ◡ ◡ / - ◡ ◡ / ◡

iii. ◡ ; - ◡ ◡ / - ◡ ◡ / ◡

iv. ◡ ; ◡ - - / - ◡ ◡ / ◡

v. ◡ ; - ◡ - / - ◡ ◡ / ◡

vi. ◡ ; ◡ ◡ - / - ◡ ◡ / ◡

## 07. "අසම්බාධ" වෘත්තය

**ම්තා නො සො ගා'ක්ඛ නිධියති ර සම්බාධො**

◡ ◡ ◡ / ◡ ◡ - / - - - / - - ◡ / ◡ ◡

## 08. "මන්දාක්‍රාන්ත" වෘත්තය

**මන්දක්කන්තා, ම-භ-න-ත-ත-ගා- ගො යුග-ඡච සසකෙහි**

◡ ◡ ◡ / ◡ - - / - - - / ◡ ◡ -

◡ ◡ - / ◡ ◡

## 09. "දෝධක" වෘත්තය

**දොධක මිච්ඡති වෙ භ-භ-භා ගා**

◡ - - / ◡ - - / ◡ - - / ◡ ◡

[1] 01 වන ගාථාවේ සිට 04 වන ගාථාව දක්වා "**මාලිනී**" වෘත්තය. (නනමයයයුතායං මාලනී භොගසීහී) – 68 වන පිටුවෙහි අංක 01 වෘත්තය බලන්න.

[2] 20 වන ගාථාව "**උපජාත**" වෘත්තය. (ඉන්ද්‍රවජ්‍ර උපේනද්‍රවජ්‍ර-මිශ්‍ර වෘත්තයි.) 68 වන පිටුවෙහි අංක 03 වෘත්තය බලන්න.

[3] 21 වන ගාථාව "**ඉන්ද්‍රවජ්‍ර**" වෘත්තය. (ඉන්ද්‍රාදිකා තා වජිරා ජගාගෝ) – 68 වන පිටුවෙහි අංක 02 වෘත්තය බලන්න.

[4] 22 වන ගාථාවේ සිට 27 දක්වා "**උපජාත**" වෘත්තය. (ඉන්ද්‍රවජ්‍ර උපේනද්‍රවජ්‍ර-මිශ්‍ර වෘත්තයි.)

[5] 39 වන ගාථාවේ සිට 45 වන ගාථාව දක්වා "**භුජඞ්ගප්‍රයාත**" වෘත්තයි. (භුජඞ්ගප්පයාතං භවේ වේදයේහී.) – 69 වන පිටුවෙහි අංක 04 වෘත්තය බලන්න.

[6] 46 වන ගාථාව "**වසන්ත තිලකා**" වෘත්තයි. (වුත්තා වසන්තකිලකා තභජා ජගාගෝ.) – 69 වන පිටුවෙහි අංක 05 වෘත්තය බලන්න.

[7] 47 වන ගාථාව "**ඉන්ද්‍රවජ්‍ර**" වෘත්තය. (ඉන්ද්‍රාදිකා තා වජිරා ජගාගෝ) – 68 වන පිටුවෙහි අංක 02 වෘත්තය බලන්න.

[8] 48 වන ගාථාවේ සිට 54 වන ගාථාව දක්වා "**වසන්ත තිලකා**" වෘත්තයි. (වුත්තා වසන්තකිලකා තභජා ජගාගෝ.) – 69 වන පිටුවෙහි අංක 05 වෘත්තය බලන්න.

[9] 55 වන ගාථාවේ සිට 67 වන ගාථාව දක්වා අට්ඨක්ඛර පාද **"විසම" වෘත්තයි. * නට්ඨක්ඛරෙසු පාදේසු ස්නාධිම්හා යොණණවා වත්තං** යනු අට්ඨක්ෂර පාදයෙහි ආදියෙහි (මුලෙහි) අක්ෂරයා කෙරෙන් පරව "ස- න" ගණයෝ නොවෙත්. අකුරු 4 කින් පරව "ය" ගණයම වේ. මේ වෘත්ත වක්ත්‍ර යි.

මෙහි ලක්ෂණ ස්ථාන කොටස් 4 කි.

i මූල වර්ණය ලඝු හෝ ගුරෙක් වීම.

ii මුල් අකුරෙන් පරව “ස” ගණ- “න” ගණ අතහැර සෙසු ගණ 6 න් එකක් වීම.

iii අකුරු 4 කින් පසුව “ය” ගණ පමණක් වීම.

iv අන්ත අක්ෂරය ලඝු හෝ ගුරෙක් වීම.

– 69 වන පිටුවෙහි අංක 06 වෘත්තය බලන්න.

10 68 වන ගාථාවේ සිට 73 වන ගාථාව දක්වා “**උපජාත**” වෘත්තය. (ඉන්ද්‍රවජ්‍ර උපේනද්‍රවජ්‍ර-මිශ්‍ර වෘත්තයි.) 68 වන පිටුවෙහි අංක 03 වෘත්තය බලන්න.

11 74 යන ගාථාව “**වසන්ත තිලකා**” වෘත්තයි. (වුත්තා වසන්තකිලකා නභජා ජගාගෝ.) – 69 වන පිටුවෙහි අංක 05 වෘත්තය බලන්න.

12 75 වන ගාථාවේ සිට 79 වන ගාථාව දක්වා “**උපජාත**” වෘත්තය. (ඉන්ද්‍රවජ්‍ර උපේනද්‍රවජ්‍ර-මිශ්‍ර වෘත්තයි.) 68 වන පිටුවෙහි අංක 03 වෘත්තය බලන්න.

13 80 වන ගාථාව සහ 81 වන ගාථාව “**ඉන්ද්‍රවජ්‍ර**” වෘත්තය. (ඉන්ද්‍රාදිකා තා වජිරා ජගාගෝ) – 68 වන පිටුවෙහි අංක 02 වෘත්තය බලන්න.

14 82 වන ගාථාවේ සිට 86 වන ගාථාව දක්වා “**අසම්බාධ**” වෘත්තය. (මතා නෝ සෝ ගා’ක්ඛ නිධියති ර සම්බාධෝ) – 69 වන පිටුවෙහි අංක 07 වෘත්තය බලන්න.

15 87 වන ගාථාවේ සිට 96 වන ගාථාව දක්වා “**වසන්ත තිලකා**” වෘත්තයි. (වුත්තා වසන්තකිලකා නභජා ජගාගෝ.) – 69 වන පිටුවෙහි අංක 05 වෘත්තය බලන්න.

16 97 වන ගාථාවේ සිට 99 වන ගාථාව දක්වා "**මන්දාක්‍රාන්ත**" වෘත්තයි. (**මන්දක්කන්තා,** ම-භ-න-ත-ත-ගා- ගො යුගු-ත්ව-සසකෙහි.) – 69 වන පිටුවෙහි අංක 08 වෘත්තය බලන්න.

17 100 වන ගාථාවේ සිට 106 වන ගාථාව දක්වා "**වසන්ත** තිලකා" වෘත්තයි. (වුත්තා වසන්තකිලකා නභජා ජගාගෝ.) – 68 වන පිටුවෙහි අංක 04 වෘත්තය බලන්න.

18 107 වන ගාථාවේ සිට 113 වන ගාථාව දක්වා අට්ඨක්ඛර පාද **විසම වෘත්තයි**. 18 හා සමානව යෙදේ. – 69 වන පිටුවෙහි අංක 06 වෘත්තය බලන්න.

19 114 වන ගාථාවේ සිට 116 වන ගාථාව දක්වා "**වසන්ත තිලකා**" වෘත්තයි. (වුත්තා වසන්තකිලකා නභජා ජගාගෝ.) – 69 වන පිටුවෙහි අංක 05 වෘත්තය බලන්න.

20 117 වන ගාථාවේ සිට 127 වන ගාථාව දක්වා "**දෝධක**" වෘත්තයි. (**දොධක** මිච්ඡති වෙ භ-භ-භා ගා.) – 70 වන පිටුවෙහි අංක 09 වෘත්තය බලන්න.

21 157 වන ගාථාව අට්ඨක්ඛර පාද "**විසම**" වෘත්තයි. – 69 වන පිටුවෙහි අංක 06 වෘත්තය බලන්න.

22 158 වන ගාථාව "**වසන්ත තිලකා**" වෘත්තයි. (වුත්තා වසන්තකිලකා නභජා ජගාගෝ.) – 69 වන පිටුවෙහි අංක 05 වෘත්තය බලන්න.